







# කාර්ය සාධනය
# செயலாற்றுகை
# PERFORMANCE
# 2015







**පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**
**மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி, அமைச்சு**
**MINISTRY OF PROVINCIAL COUNCILS & LOCAL GOVERNMENT**

**පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

330, යුනියන් පෙදෙස, කොළඹ 02

# කාර්ය සාධන වාර්තාව 2015

# පටුන


| | | |
|---|---|---|
| ප්‍රවේශය | | 05 |
| 1. | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ දැක්ම | 07 |
| 2. | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මෙහෙවර | 07 |
| 3. | අමාත්‍යාංශයේ විෂයයන් හා කාර්යයන් | 08 |
| 4. | අමාත්‍යාංශය යටතේ ඇති විවිධ අංශ හා ව්‍යවස්ථාපිත මණ්ඩල | 09 |
| 5. | අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හඳුනාගෙන ඇති ප්‍රමුඛ ක්ෂේත්‍ර | 10 |
| 6. | කාර්ය සාධනය - 2015 | 12 |
| 6.1. | පළාත් පාලනයට අයත් ජාතික නීති වර්තමානයට ගැළපෙන අයුරින් සකස් කිරීම | 12 |
| 6.2. | පළාත් සභා සහ පළාත් පාලන ආයතන මට්ටමේ ප්‍රශස්ත පාලනයක් සඳහා අවශ්‍ය සහය ලබා දීම | 13 |
| 6.3. | පළාත් පාලන ආයතනවල සේවා සැපයීම කාර්යක්ෂම කිරීම | 16 |
| 6.4. | පළාත් සභා සඳහා සහාය සේවා සම්පාදනය කිරීම | 25 |
| 6.5. | සමතුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම | 29 |

# ප්‍රවේශය

ආර්ථික හා සමාජ සංවර්ධනය වූ කලී ලෝකයේ සෑම රටකම ප්‍රමුඛතම ඉලක්කයක් මෙන්ම අවශ්‍යතාවයකි. ශ්‍රී ලංකාව ද උත්සාහ දරන්නේ ආර්ථිකමය හා සමාජීය වශයෙන් දියුණු සංවර්ධිත මට්ටමක් කරා ගමන් කිරීමටය. මේ ක්‍රියාදාමයේදී ප්‍රාදේශීය මට්ටමින් හා පළාත් මට්ටමින් පවතින අසමානතා අවම කිරීමටත් ජාතික ආර්ථික සංවර්ධනයට දායකත්වය ලබාදීමටත් රටේ ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලිය වැඩිදුරටත් ශක්තිමත් කිරීමටත් ප්‍රශස්ත සේවාවක් මෙරට ක්‍රියාත්මක පළාත් සභා හා පළාත් පාලන පද්ධතියෙන් ඉෂ්ට වී තිබේ.

පසුගාමී පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදීම මගින් ඒවායේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට හා අවශ්‍ය යන්ත්‍රෝපකරණ ලබාදීම සඳහා කටයුතු කර ඇත. විශේෂයෙන් දෛනික නඩත්තු කටයුතු පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ආදායම් තත්ත්වයක් නොමැතිකම නිසා බොහෝ ප්‍රාදේශීය සභාවලට විවිධ දුෂ්කරතාවන්ට මුහුණදීමට සිදුවන බැවින් එවැනි ප්‍රාදේශීය සභා තෝරාගෙන ඒවායෙහි අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු සඳහා ද මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත.

වර්තමානයේ මුළු මහත් ලෝකයටම අභියෝගයක් වී පවතින ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට ඒ සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීමට මෙම අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ලැබේ. මෙහි මූලික අදියරක් වශයෙන් අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා සෙසු පහසුකම් පළාත් පාලන ආයතන වෙත ලබාදීමට කටයුතු කර තිබේ.

පළාත් සභා හා පළාත් පාලන ආයතන පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කටයුතු සඳහා මූලිකත්වය ලබාදී ඇති අතර මේ වන විට මෙම ක්ෂේත්‍රය මුහුණ දී තිබෙන යටිතල පහසුකම් සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය හා සමාජ ආර්ථික දේහය තුළ මුහුණ දෙන ගැටලුවලදී අන්තර්ජාතික ආයතන හරහා ලබාදෙන සම්පත් කාර්යක්ෂමව යෙදවීම සඳහා වන ප්‍රමුඛ කාර්යභාරය 2015 වසරේදී සාර්ථකව ඉටුකිරීමට හැකි විය.

දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් නිර්මාණය වීමට නම් ප්‍රශස්ත ප්‍රාදේශීය පාලන ව්‍යුහයක් ස්ථාපනය කිරීම අත්‍යවශ්‍යය. ඒ සඳහා පළාත් සභා හා පළාත් පාලන ආයතන ක්‍රමයෙහි පවත්නා ප්‍රශස්ත තත්ත්වයන් මෙන්ම දුර්වල තත්ත්වයන්ද හඳුනාගත යුතුය. ලෝකයේ ඇතැම් රටවල දියුණු පළාත් පාලන ආයතන විසින් සාධනය කරගෙන ඇති ඉහළ කාර්යසාධන දර්ශකවලට ළඟාවිය හැකි ක්‍රියාමාර්ගවලට එළඹෙමින් ඉදිරි අවුරුදු පහ ඇතුළත මෙරට පළාත් පාලන ආයතන පද්ධතිය සමස්තයක් වශයෙන් ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම ද මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණකි.

රජයේ යහපාලන මූලධර්මවලට අනුගත වෙමින් ඒවා ආරක්ෂා කරමින් හා වර්ධනය කරමින් ඉදිරියට යන ජනතා නියෝජිතයන්, රාජ්‍ය සේවකයන් සහ සිවිල් සමාජය යන අංශත්‍රයම විධිමත්ව කළමනාකරණය කිරීමේ පරිපාලන රාමුවක අවශ්‍යතාව මෙන්ම විශේෂයෙන් ප්‍රාදේශීය

සංවර්ධන ව්‍යාපෘති සැලසුම්කරණය, අයවැයකරණය, ක්‍රියාත්මක කිරීම, පසු විපරම හා භාරකාරත්වය යන කාර්යයන්හිදී ප්‍රජා සහභාගිත්වය වර්ධනය කිරීම කෙරෙහි ද මෙම අමාත්‍යාංශයේ අවධානය යොමු වී තිබේ.

2015 සැප්තැම්බර් මාසයේදී පළාත් සභා විෂයයට පළාත් පාලන විෂයය ඇතුළත්ව නව අමාත්‍යාංශය ස්ථාපිත වීමත් සමග ඉදිරි පස්වසර සඳහා ක්‍රියාත්මක වැඩ සැලැස්මක් සකස් කර 2016 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ. විශේෂයෙන්ම පළාත් පාලන ආයතන පනත් වර්තමානයට ගැළපෙන පරිදි යාවත්කාලීන කිරීම, අපද්‍රව්‍ය බැහැරලීමේ අභියෝගය ජයගැනීම සඳහා අදාළ වෙනත් අමාත්‍යාංශ හා ආයතන සම්බන්ධීකරණය කර ජාතික ප්‍රතිපත්තියක් හා ක්‍රමවේදයක් සකස් කිරීම, දූෂණය හා වංචාව පිටුදැක කාර්යක්ෂම ආයතන පසුබිමක් හඳුන්වාදීම කෙරෙහි ප්‍රමුඛ අවධානයක් යොමු කර එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් මූලික ක්‍රියාමාර්ග ගෙන තිබේ.

ඒ සමගම නව පරිගණක තාක්ෂණික ක්‍රමවේද යොදා ගනිමින් දැනට අත්හදා බලා ඇති පෙරටු කාර්යාල ක්‍රමය සියලුම පළාත් පාලන ආයතනවලට හඳුන්වාදීම, ජාතික ආර්ථිකය තුළ පළාත් සභා හා පළාත් පාලන ආයතන වගකිවයුතු කාර්යභාරයක් ඉටු කරන ව්‍යුහයක් නිර්මාණය කිරීම මෙන්ම සමාජ සංස්කෘතික ක්‍රියාවලිය තුළ සමාජය මග ගැන්වීමේ ක්‍රියාදාමයකට යොමු කිරීම පිළිබඳව ඉලක්කගත වැඩපිළිවෙලක් හඳුන්වාදීම ද අමාත්‍යාංශයේ ඉදිරි සැලැස්මෙහි ප්‍රධාන අංගයකි.

1

## දැක්ම

බලය බෙදාහැරීම, විමධ්‍යගතකරණය සහ සහභාගීත්ව පාලන ක්‍රමය ප්‍රවර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාව තුළ සමතුලිත සහ තිරසාර සංවර්ධනයක් ස්ථාපිත කිරීමෙහිලා කටයුතු කරන ප්‍රශස්ත ආයතනය බවට පත් වීම.

2

## මෙහෙවර

ජනතා අභිලාශයන් සඵල කරවන අන්දමේ කාර්යක්ෂම හා ඵලදායී පළාත් සභා සහ පළාත් පාලන ක්‍රමයක් තහවුරු කිරීම සහ විමධ්‍යගත පාලන ව්‍යුහය සවිමත් කිරීමත් දිරිගැන්වීමත් මගින් ශ්‍රී ලංකාව තුළ සමතුලිත සහ තිරසාර මානව සංවර්ධනයක් උදාකර ගැනීම සඳහා පහසුකම් සම්පාදනය.

# 3

# පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ විෂයයන් හා කාර්යයන්

- 2015-09-21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නව අමාත්‍යාංශවල විෂයයන් හා කාර්යයන් පිළිබඳ නිවේදනයට අනුව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ විෂයයන් හා කාර්යයන් පහත පරිදි වේ.
- පළාත් සභා හා පළාත් පාලන විෂයයන්ට සහ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හා දේශීය ණය සංවර්ධන අරමුදල යන ආයතනයන්හි අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- පළාත් සභාවලට අදාළ කටයුතු නියාමනය කිරීම
- පළාත් සභාවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයන් පුහුණු කිරීම
- පළාත් පාලන ආයතනවලට අදාළ රජයේ කර්තව්‍යයන්
- පොදු පහසුකම් සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතනවලට ණය පහසුකම් ලබාදීම
- පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයන් පුහුණු කිරීම
- පළාත් සභා හා පළාත් පාලන ආයතන පරිපාලනයෙහි සෑම මානයක් සම්බන්ධයෙන්ම පර්යේෂණ පැවැත්වීම
- ශ්‍රී ලංකා ආයතනය හා දේශීය ණය සංවර්ධන අරමුදල යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයය කටයුතු
- පූර්වෝක්ත ආයතනයන් අධීක්ෂණය කිරීම

# 4

# අමාත්‍යාංශය යටතේ ඇති විවිධ අංශ හා ව්‍යවස්ථාපිත මණ්ඩල

1. **පළාත් සභා හා පළාත් පාලන ආයතනවල අවශ්‍යතාවයන්ට අනුකූලතාව දැක්වීම වඩාත් පහසුකරලීම සඳහා අමාත්‍යාංශය යටතේ පවතින විවිධ අංශ හා ආයතන.**
2. **පළාත් සභා හා පළාත් පාලන** ගරු අමාත්‍යතුමාගේ කාර්යාලය
3. පළාත් සභා හා පළාත් පාලන ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යාලය
4. අමාත්‍යාංශ ලේකම් කාර්යාලය
5. පළාත් පාලන අංශය
   - I පළාත් පාලන ප්‍රතිසංස්කරණ ඒකකය
   - II පළාත් පාලන පැමිණිලි හා තොරතුරු ඒකකය
   - III තොරතුරු තාක්ෂණ ඒකකය
6. පළාත් සභා අංශය
7. සංවර්ධන හා සැලසුම් අංශය
   - I ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම
   - II කුඩා හා මධ්‍ය පරිමාණ නගර සංවර්ධනය
   - III විදේශ ව්‍යාපෘති සම්බන්ධීකරණය
   - IV මෙහෙයුම් ඒකකය
8. පාලන අංශය
   - I මානව සම්පත් සංවර්ධනය
   - II ප්‍රවාහන පහසුකම් සැපයීම
   - III ආයතනික කටයුතු
9. නීති අංශය
10. මුදල් අංශය
    - I ගිණුම් හා ගෙවීම් අංශය
    - II ප්‍රසම්පාදන අංශය
11. වියදම් විමංසන අංශය
12. අභ්‍යන්තර විගණන අංශය
13. ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය
    - I ඩෙංගු මර්ධන ඒකකය
14. මාධ්‍ය ඒකකය
15. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
16. දේශීය ණය සහ සංවර්ධන අරමුදල

# 5

# අමාත්‍යාංශයේ අරමුණු සාධනය කර ගැනීම සඳහා හඳුනාගෙන ඇති ප්‍රමුඛ ක්ෂේත්‍ර

## 1. පළාත් පාලනයට අයත් ජාතික නීති වර්තමානයට ගැලපෙන අයුරින් සකස් කිරීම

*ක්‍රියාකාරකම්:-*

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත හා පළාත් පාලන (විශේෂ විධිවිධාන) පනත සම්මත කරගැනීම
- මහනගර සභා ආඥා පනත සංශෝධනය කිරීම
- නගර සභා ආඥා පනත සංශෝධනය කිරීම
- ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම

මේ යටතේ පහත සඳහන් කාර්යයන් සිදු කෙරෙනු ඇත.

- පළාත් පාලන පරිපාලනය, පිරිස් පාලනය, ආදායම් උත්පාදනයට අදාළ නීති යාවත්කාලීන කිරීම
- මහජන සෞඛ්‍යයට හා පරිසරයට අදාළ නීති යාවත්කාලීන කිරීම
- කාලීන අවශ්‍යතාවය පරිදි භෞතික සැලසුම් හා සංවර්ධනයට අදාළ නව නීති සකස් කිරීම
- පොදු උපයෝගිතා සේවා පිළිබඳ නීති සකස් කිරීම

## 2. පළාත් සභා සහ පළාත් පාලන ආයතන මට්ටමේ ප්‍රශස්ත පාලනයක් සඳහා අවශ්‍ය සහය ලබා දීම

*ක්‍රියාකාරකම්:-*

- දැනුවත් කිරීම හා පුහුණු කිරීම (පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මෙහෙයවීම මත දේශපාලන නායකයින් සහ නිලධාරීන් පුහුණු කිරීම)
- කාර්යය මණ්ඩල අවශ්‍යතා සපුරාලීම
- නීති කෙටුම්පත් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ හැකියාව ප්‍රවර්ධනය
- පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීම
- පළාත් පාලන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම

## 3. පළාත් පාලන ආයතනවල සේවා සැපයීම කාර්යක්ෂම කිරීම

*ක්‍රියාකාරකම්:-*

- ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය
- පරිගණක ආශ්‍රිත සේවා සැපයීමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම
- අපද්‍රව්‍ය කළමනාකරණය
- මළාපවාහන පද්ධති කළමනාකරණය

- පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ, වාහන අවශ්‍යතා සපුරා ගැනීමට සහායවීම
- අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතනවල මහජන සේවා පහසුකම් ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම
  - යටිතල පහසුකම් සංවර්ධනය
  - නඩත්තු කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා කටයුතු කිරීම

## 4. පළාත් සභා සඳහා සහාය සේවා සම්පාදනය කිරීම

*ක්‍රියාකාරකම්:-*

- පළාත් සභාවලට අවශ්‍ය පුනරාවර්තන වියදම් නිදහස් කිරීම
- පළාත් සභාවල වියදම් විමංසනය කිරීම

## 5. සමතුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම

*ක්‍රියාකාරකම්:-*

- ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම සඳහා දේශීය හා විදේශ ආයෝජන යෙදවීමට කටයුතු කිරීම
- ප්‍රාදේශීය මාර්ග, සෞඛ්‍ය, අධ්‍යාපනය සහ අනෙකුත් පොදු පහසුකම් නංවාලීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම
- කුඩා හා මධ්‍ය පරිමාණ නගර මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම
- ප්‍රාදේශීය ආර්ථික කේන්ද්‍රස්ථාන දියුණු කිරීම
- දේශිය ණය සහ සංවර්ධන අරමුදල මගින් පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නංවාලීම

# 6

# කාර්ය සාධනය - 2015

## 6.1 පළාත් පාලනයට අදාළ ජාතික නීති වර්තමානයට ගැළපෙන අයුරින් සකස් කිරීම

### 6.1.1. නීති අංශය

1. පළාත් පාලන ආයතනවල කාර්යසාධනය නගා සිටුවීමට අදාළ හඳුනාගත් ක්ෂේත්‍ර සඳහා ආදර්ශ අතුරු ව්‍යවස්ථා සකස් කරදීම සඳහා උපදේශාත්මක සැසි පැවැත්වීම මගින් අදහස් ලබා ගැනීම
2. ඉහත පරිදි ලබා ගත් අදහස් හා තොරතුරු ඇසුරින් නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ආදර්ශ අතුරු ව්‍යවස්ථා 60ක් භාෂාත්‍රයෙන් සකස් කිරීම
3. පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා සම්මත කරගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙල කිරීම
4. පළාත් සභා ප්‍රඥප්ති සම්පාදනයෙහිලා අවශ්‍ය නෛතික සහාය ලබාදීම
5. පළාත් පාලන ආයතන ජාතික සීමා නිර්ණය කිරීමේ කමිටුවේ කටයුතු සම්බන්ධීකරණය
6. මහා නගර සභා ධාරිතා සංවර්ධනය සඳහා මුදල් කොමිෂන් සභාවේ අනුග්‍රහයෙන් සිදු කරනු ලබන නියමු ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කිරීම
7. පුර නැගුම ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් පළාත් පාලන ආයතනවල ක්‍රමවේද විධිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය සංශෝධන පිළිබඳ යෝජනාවලිය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම

### 6.1.2. සීමා නිර්ණයනය කිරීමේ ජාතික කමිටුව

1. අවසන් වාර්තාව මහජන ප්‍රදර්ශනයට තබා යෝජනා ලබාගැනීම හා සාක්ෂි කැඳවීම
2. සියලු යෝජනා නිරීක්ෂණය කර කමිටු නිර්දේශ මත අවසන් වාර්තාව සංශෝධනය කිරීම
3. සංශෝධන ඇතුළත් කර නව ගැසට් නිවේදන වාර්තාව සකස් කිරීම
4. අවසන් වාර්තාවට අනුව සිතියම් සංශෝධනය කිරීම (මිනින්දෝරු දෙපාර්තමේන්තුව)
5. අවසන් වාර්තාව සකස් කර 2015-05-31 දින අමාත්‍යවරයා වෙත භාර දීම

## 6.2 පළාත් සභා සහ පළාත් පාලන ආයතන මට්ටමේ ප්‍රශස්ත පාලනයක් සඳහා අවශ්‍ය සහය ලබා දීම

### 6.2.1. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය 1999 අංක 31 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කර ඇති මෙම ආයතනයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිල බලයෙන් සාමාජිකයන් 8 දෙනෙක් සහ අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා විසින් පත්කරනු ලබන සාමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත් කර ඇත. මෙහි පරිපාලන කටයුතු සිදුකරනු ලැබෙන්නේ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂකවරයා විසිනි.

#### දැක්ම

කළමනාකරණ, උපදේශන, පර්යේෂණ සහ පුහුණු කිරීම් මගින් පළාත් පාලන සහ පළාත් සභා ආයතනවල කළමනාකරණ, මූල්‍ය කළමනාකරණ සහ තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීමේ එකම ආයතනය බවට පත්වෙමින් මහජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට උරදීම.

#### මෙහෙවර

කළමනාකරණය, උපදේශනය, පර්යේෂණ සහ පුහුණු කිරීම් මගින් පළාත් පාලන සහ පළාත් සභා ආයතනයන්හි කළමනාකරණ, මූල්‍ය කළමනාකරණ හා තාක්ෂණික හැකියාවන් වැඩි දියුණු කිරීම.

#### කාර්යභාරය

- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයන් හි සහභාගීත්වය ඇතිව පළාත් පාලනය හා සම්බන්ධ ආයතනයන්හි ආයතනික ශක්තිය වැඩි දියුණු කරලීම සඳහා පුහුණු කිරීම් උපදේශන සේවා හා පර්යේෂණ දියත්කිරීම.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්හි කාර්යක්ෂමතාව වැඩි දියුණු කරලීම පිණිස පළාත් කළමනාකරණ සහ පුහුණු ඒකක ශක්තිමත් කිරීම.
- පළාත් පාලනයේ සියලු පාර්ශවකරුවන්ට තාක්ෂණ හා තොරතුරු සේවා සපයමින් ජාතික සම්පත් මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- ජාතික හා අන්තර් ජාතික ආයතන සමග සබඳතා පවත්වා ගනිමින් පළාත් පාලනයේ කේන්ද්‍රීය ස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණය සහ ආයතනික කටයුතු වැඩිදියුණු කිරීම සම්බන්ධව විශේෂඥ සේවා සැපයීම.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතන වලට අදාළ දත්ත හා තොරතුරු එක් රැස්කිරීම සහ එම තොරතුරු පවත්වා ගෙන යාම.
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළාත් පාලනයට සම්බන්ධිත ආයතන සමග අන්තර් සබඳතා ගොඩනගාගනිමින් පළාත් පාලනය පෝෂණය කිරීම.
  - ජාතික / ප්‍රාදේශීය මට්ටමේ පුහුණු වැඩමුළු
  - අන්තර් ජාතික / ජාතික මට්ටමේ සම්මන්ත්‍රණ

- ප්‍රායෝගික සැසි - උදාඃ- අතුරු ව්‍යවස්ථා සකස් කිරීම/පළාත් පාලන ආයතනවල අවසන් ගිණුම් සැකසීි
- ඩිප්ලෝමා පාඨමාලා
  - a. පළාත් පාලන උසස් ඩිප්ලෝමා
  - b. පළාත් පාලන ඩිප්ලෝමා
  - c. මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමා
  - d. පළාත් පාලන ඉංජිනේරු ඩිප්ලෝමා
- සහතික පත්‍ර පාඨමාලා
  - a. ව්‍යාපෘති කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව
  - b. පුස්තකාල කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව
  - c. මානව සම්පත් කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව
  - d. AutoCAD මෘදුකාංග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
  - e. පළාත් පාලන නීතිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
  - f. ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
  - g. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
  - h. දෙමළ භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
  - i. පරිගණක සහතික පත්‍ර පාඨමාලාව
- පර්යේෂණ
- උපදේශන සේවා සැපයීම
- අත්පොත්, අත්පත්‍රිකා ප්‍රකාශයට පත්කිරීම
- ත්‍රෛමාසික "පළාත් පාලන" පුවත් පත (සිංහල සහ දෙමළ මාධ්‍ය) සහ "පළාත් පාලනය" පිළිබඳ වාර්ෂික සඟරාව ප්‍රකාශයට පත් කිරීම.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතයේ අංශ මට්ටමින් කාර්යසාධනය - 2015

| අංශය | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | මුළු වියදම | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| ඉංජිනේරු අංශය | 22 | 1,986,728.12 | 1,748 |
| මූල්‍ය කළමනාකරණ අංශය | 06 | 2,212,598.26 | 1,238 |
| පොදු කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය | 20 | 2,156,118.90 | 1,824 |
| භෞතික සැලසුම් අංශය | 18 | 1,811,108.30 | 1,367 |
| පර්යේෂණ අංශය | 16 | 2,190,538.70 | 1,139 |
| නීති හා ව්‍යවස්ථාදායක කටයුතු අංශය | 22 | 2,058,311.57 | 1,938 |
| ධාරිතා සංවර්ධන අංශය | 26 | 1,359,313.50 | 636 |
| පුහුණු අංශය | 45 | 2,873,705.95 | 2,120 |
| **එකතුව** | **175** | **16,648,423.30** | **12,010** |

## 6.2.2. පළාත් පාලන සතිය

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතිය තුළ එම ආයතන විසින් ඉටුකරනු ලබන මහජන උපයෝගිතා සේවා ප්‍රවර්ධනයට අවශ්‍ය කටයුතු කිරීමත් එම ආයතනයන්හි මානව හා භෞතික සම්පත් උපයෝගී කරගැනීම තුළින් පළාත් පාලන ආයතන මගින් මහජනතාව වෙත උපරිම කාර්යක්ෂමතාවයකින් සේවා සැපයීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීමත් පළාත් පාලන ආයතන පිළිබඳව හා මහජන සේවාවන් පිළිබඳව ජනතාව අතර යහපත් ආකල්පයක් හා සම්බන්ධතාවය ගොඩනැගීමත් මෙහි අරමුණ වේ.

වාර්ෂිකව පැවැත්වෙන පළාත් පාලන සතිය වැඩසටහන පළාත් සභාවල ද සහාය ඇතිව මෙම අමාත්‍යාංශයේ පළාත්පාලන අංශය මගින් සැප්තැම්බර් 07 - 13 අතර කාලය තුළ දීපව්‍යාප්තව පැවත්වීමට කටයුතු කෙරිණි.

| 2015 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු.මි. | 2015-12-31 දිනට වියදම රු.මි. | 2015-12-31 භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 6.0 | 6.0 | 75% |

## 6.2.3. පළාත් පාලන කළමනාකරණ තරගය සහ ස්වර්ණ පුරවර සම්මාන උළෙල

මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පළාත් පාලන ආයතනයන්හි යහපාලනය හා කළමනාකරණ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස ජාතික මට්ටමෙන් පළාත් පාලන කළමනාකරණ තරගය පවත්වා ජයග්‍රාහී ආයතනවල ත්‍යාග හා සහතික ප්‍රදානය කිරීම සහ එම ජයග්‍රාහි ආයතන ජාතික මට්ටමින් ඇගයීමට ලක්කර ස්වර්ණ පුරවර සම්මාන උළෙල පැවැත්වීම සඳහා පළාත් පාලන ආයතන තෝරා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කෙරිණි.

## 6.3 පළාත් පාලන ආයතනවල සේවා සැපයීම කාර්යක්ෂම කිරීම

### 6.3.1. පළාත් පාලන ආයතන දත්ත පද්ධතියක් සකස් කිරීම

- සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ, නියෝජ්‍ය ප්‍රධානීන්ගේ සහ පරිපාලන නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් පළාත් පාලන ආයතන තොරතුරු සංග්‍රහයක් මුද්‍රණය කර රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වෙත ලබා දීම.
- පළාත් පාලන ආයතනවල මූලික තොරතුරු ඇතුළත් විධිමත් වූ දත්ත පද්ධතියක් නිර්මාණය කර ඒ සඳහා දත්ත ඇතුළත් කිරීම.
- පළාත් පාලන ආයතනවල පරිපාලන, සංවර්ධන සහ මූල්‍යමය තොරතුරු ඇතුළත් දත්ත පරිශීලනය කිරීම සඳහා අමාත්‍යාංශයේ නව ඒකකයක් ස්ථාපිත කිරීම.

### 6.3.2. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

**දැක්ම**

සැමට වඩාත් සුවපහසු පරිසරයක්

**අරමුණ**

පළාත් පාලන බල ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම

**කාර්යභාරය**

1. පළාත් පාලන ආයතන සඳහා විධිමත් හා යෝග්‍ය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් හඳුන්වාදීම පිණිස කාර්යපටිපාටි සංග්‍රහ සම්පාදනය සහ උපදේශනය සැපයීම.
2. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ නිසි තාක්ෂණ සහාය පළාත් සභා සහ පළාත් පාලන ආයතන වෙත ලබාදීම.
3. ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ දේශීය හා විදේශීය අත්දැකීම් නිර්මාණයෙහිලා පළාත් පාලන ආයතන දිරිගැන්වීම.
4. යහ කළමනාකරණය හා පුරෝගාමී අත්දැකීම් නිර්මාණයෙහිලා පළාත් පාලන ආයතන දිරිගැන්වීම.
5. රාජ්‍ය නොවන සංවිධාන හා මූල්‍ය ආයතනයන්ගෙන් තාක්ෂණික හා මූල්‍යමය සහාය ලබාගැනීමට පළාත් පාලන ආයතනවලට සහායවීම.
6. පළාත් පාලන ආයතන තුළ පාරිසරික සංරක්ෂණ මධ්‍යස්ථාන ඉදිකිරීම
   - පාරිසරික සංරක්ෂණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම (කොම්පෝස්ට් ව්‍යාපෘතීන්)
   - පවතින කාබනික පොහොර නිෂ්පාදන (කොම්පෝස්ට්) ව්‍යාපෘතීන් වැඩිදියුණු කිරීම
7. අවසන් අපහරණ භූමි වැඩිදියුණු කිරීම

8. 3 R ක්‍රමවේදය වැඩිදියුණු කිරීම

- ගෘහස්ථ කසල කළමනාකරණය සඳහා කොම්පෝස්ට් බැරල් හා කසළ බඳුන් ලබාදීම.
- පළාත් පාලන ආයතන බලප්‍රදේශයන්හි නාගරික කසල ක්‍රමවත්ව එකතු කිරීම සඳහා කසල බඳුන් ලබාදීම.

9. 3 R ක්‍රමවේදය වැඩිදියුණු කිරීම යටතේ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

- පළාත් පාලන ආයතනවල කසල කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා කසල වෙන් කර එකතු කිරීමේ ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- කොරියන් ආධාර යටතේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ 3 ඍ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සඳහා නිවාස 225 ක් සඳහා කොම්පෝස්ට් බඳුන්, කසල වෙන්කිරීමේ බඳුන් හා පොලිතින් ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සඳහා සුදුසු බෑග් ලබාදීම.
- ගෘහස්ත කසල ක්‍රමවත්ව එකතු කිරීම සඳහා කොම්පෝස්ට් බඳුන් ලබාදීම.

10. දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට හැකියා වර්ධන පුහුණු වැඩමුළු පැවැත්වීම

  මේ යටතේ කම්කරුවන්ගේ හැකියා වර්ධන පුහුණු වැඩමුළු හා ජාතික වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. (National Vocational Qualification - NVQ)
- මඩකලපුව දිස්ත්‍රික්කය සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. (පළාත් පාලන ආයතන 12 සඳහා)
- කාබනික පොහොර නිෂ්පාදනයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ එක්දින පුහුණු වැඩමුළුවක් පැවැත්වීම (සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන 27 ක නිලධාරීන් සඳහා)

11. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වාහන සහ උපකරණ ලබාදීම

- කසල එකතු කිරීම වැඩිදියුණු කිරීම සඳහා සංඥානාද උපකරණ කට්ටල ලබාදීම
- කසල කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා වාහන ලබාදීම (ට්‍රැක්ටර්/ගලිබවුසර්/කම්පැක්ටර් ආදිය)

12. විශේෂ ව්‍යාපෘති

- දීප ව්‍යාප්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ තරගය පැවැත්වීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම හා ඩෙංගු මර්දන කටයුතු දිරිමත් කිරීම සඳහා ගුවන් විදුලි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## කොම්පෝස්ට් ව්‍යාපෘතිය - පඬුවස්නුවර





## 2015 කාර්යසාධනය

- 2015 සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු.මි. 90
- 2015 වර්ෂාවසානයට මුළු වියදම රු.මි. 66.00
- 2015 වර්ෂාවසානයට භෞතික ප්‍රගතිය 83%

❖ 2014 වර්ෂයේ අවිච්ඡේද වැඩ

| අනු අංකය | ව්‍යාපෘතිය | 2015 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු. | 2015 12.31 දිනට වියදම | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1 | මළාපවහන පද්ධතියේ ඉතිරි වැඩ කටයුතු හා වැට ඉදි කිරීම *ත්‍රිකුණාමලය නගර සභාව | 2,799,604.00 | 2,475,432.00 | 100% |
| 2 | කොම්පෝස්ට් අංගනය ඉදි කිරීම *කින්නියා ප්‍රාදේශීය සභාව | 3,057,929.00 | 2,364,319.16 | 100% |
| 3 | කොම්පෝස්ට් අංගනයේ කොන්ක්‍රීට් අතුරා ඇති පෙදෙසේ වහළ ඉදි කිරීම - හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව | 841,000.00 | 782,371.43 | 100% |
| 4 | කම්පැක්ටර් රථ 3ක් මිලදී ගැනීම | 11,000,000.00 | 18,099,900.00 | 100% |

❖ දැනට ක්‍රියාත්මක වන කොම්පෝස්ට් අංගන වැඩිදියුණු කිරීම

| අනු අංකය | ව්‍යාපෘතිය | 2015 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු. | 2015 12.31 දිනට වියදම | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| | කොම්පෝස්ට් අංගනය වැඩිදියුණු කිරීම - කොටපොල ප්‍රාදේශීය සභාව | 1,000,000.00 | 1958154.94 | 100 |
| | කොම්පෝස්ට් අංගනයේ වැඩිදියුණු කිරීමේ කටයුතු - තිහගොඩ ප්‍රා.ස. | 980,000.00 | 624,830.97 | 100 |
| | කොම්පෝස්ට් අංගනයේ කොන්ක්‍රීට් අතුරා ඇති පෙදෙසේ වහල සෑදීම - රඹුක්කන ප්‍රාදේශීය සභාව | 1,340,000.00 | 2930.847.75 | 100 |
| | කොම්පෝස්ට් අංගනය වැඩිදියුණු කිරීම - මහව ප්‍රාදේශීය සභාව | 1,000,000.00 | 928,273.75 | 100 |
| | කොම්පෝස්ට් අංගන සඳහා හලන යන්ත්‍ර 20ක් මිලදී ගැනීම | 6,682,644.00 | 6,682,644.00 | 100 |

❖ හැකියාවන් වර්ධනය කිරීම, දැනුවත් කිරීම, පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

| අනු අංකය | ව්‍යාපෘතිය | 2015 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු. | 2015 12.31 දිනට වියදම | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1 | නිලධාරීන් සඳහා කාබනික පොහොර සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 1,000,000.00 | 31,600.00 | |
| | සේවකයන් සඳහා NVQ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 1,000,000.00 | 757,830.72 | |
| 2 | 3R ක්‍රමවේදය ව්‍යාප්ත කිරීම හා ඩෙංගු මර්දන වැඩසටහන්වලට දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 2,000,000.00 | 131,760.00 | |

❖ නව කොම්පෝස්ට් අංගන ඉදි කිරීම

| අනු අංකය | ව්‍යාපෘතිය | 2015 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු. | 2015 12.31 දිනට වියදම | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| | ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | 4,500,000.00 | 2,047,505.38 | 90 |
| | පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව | 4,500,000.00 | 2,359,162.89 | 100 |

❖ ජීව වායු ඒකක ස්ථාපනය කිරීම

| අනු අංකය | ව්‍යාපෘතිය | 2015 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු. | 2015 12.31 දිනට වියදම | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| | ජීව වායු ඒකක කුඩා ප්‍රමාණයේ | 2,885,500.00 | 1,010,500.00 | 60 |

❖ ජනනය වන ස්ථානයේදීම අපද්‍රව්‍ය වෙන් කිරීම හා ගෘහස්ථ කොම්පෝස්ට් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම හා ගුණාත්මය ඉහළ දැමීම

| අනු අංකය | ව්‍යාපෘතිය | 2015 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු. | 2015 12.31 දිනට වියදම | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| | ජනනය වන ස්ථානයේදීම කසළ වෙන් කිරීම හා ගෘහස්ථ කාබනික පොහොර නිෂ්පාදනය වැඩිදියුණු කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 6,300.000.00 | 10,524,435.09 | 100 |
| | ජනනය වන ස්ථානයේදීම කසළ වෙන් කිරීම පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීම හා කසළ බඳුන් බෙදා දීමේ වැඩසටහන | 2,100,000.00 | 2,704,865.21 | 100 |

❖ කාබනික පොහොර සැකසීම සඳහා නව තාක්ෂණික ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම හා හඳුන්වා දීම (තකකුරා ක්‍රමවේදය හා වෙනත් තාක්ෂණික ක්‍රමවේදයන්)

| අනු අංකය | ව්‍යාපෘතිය | 2015 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු. | 2015 12.31 දිනට වියදම | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| | නව තාක්ෂණික ක්‍රමවේදයක් ලෙස තකකුරා කොම්පෝස්ට් සකස් කිරීමේ ක්‍රමය හා වෙනත් ක්‍රම හඳුන්වා දීම | 2,100,000.00 | 491,121.00 | 100 |

❖ ප්‍රතිපත්ති හා උපාය මාර්ග හා යහපත් පුරුදු වැඩිදියුණු කිරීම යටතේ ක්‍රියාත්මක සැලසුම් සකස් කිරීම

| අනු අංකය | ව්‍යාපෘතිය | 2015 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු. | 2015 12.31 දිනට වියදම | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| | යාපනය දිස්ත්‍රික්කයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ප්‍රධාන සැලස්ම සකස් කිරීම | 500,000.00 | 109,415.00 | 30 |

❖ කසළ ආශ්‍රිතව පැනනගින සෞඛ්‍ය ගැටළු අවම කිරීම (ඩෙංගු මර්දන වැඩසටහන් හා වසංගත රෝග පාලනය)

| අනු අංකය | ව්‍යාපෘතිය | 2015 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු. | 2015 12.31 දිනට වියදම | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| | ඩෙංගු මර්දන වැඩසටහන්, සෞඛ්‍ය වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම හා දූමායන යන්ත්‍ර 36ක් මිලදී ගැනීම | 6,765,810.00 | 8,399,370.00 | 100 |
| | උතුරු මැද හා වයඹ හදිසි ගංවතුර | 1,261,888.32 | 1,261,888.32 | 100 |

## 6.3.3. ඩෙංගු මර්දන වැඩසටහන

මෙම අමාත්‍යාංශයේ ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානයේ එක් අංශයක් ලෙස ඩෙංගු මර්දන ඒකකය ස්ථාපිත කොට ඇත.

### අරමුණ

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයට අනුබද්ධ සියලුම ආයතන මූලික කොට ගෙන ඩෙංගු අවදානම් සහිත පරිසරයන් අවම කිරීමට ආයතන දැනුවත් කරමින් අවශ්‍ය වැඩසටහන් සම්පාදනය හා ඒවා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සහාය දීම මගින් ඩෙංගුවලින් තොර පරිසරයක් ගොඩනැගීම.

### ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

- 2014 වසරේ ජනවාරි සිට මේ දක්වා ඩෙංගු මර්දනය සම්බන්ධයෙන් අමාත්‍යාංශය සහ පළාත් පාලන ආයතන මගින් සිදුකරන ලද වැඩසටහන් හා ක්‍රියාකාරකම් සහිත සම්පිණ්ඩන වාර්තාවක් සෞඛ්‍ය අමාත්‍යාංශයට හා ජනාධිපති ලේකම් කාර්යාලයට යොමු කිරීම.
- ඩෙංගු අධි අවදානම් කලාපයන් ලෙස කාලීනව නම් කරනු ලබන පළාත් පාලන ආයතන සඳහා ඔවුන් එම අවදානම් තත්ත්වයේ සිටින බවත්, අවශ්‍ය පියවර ගැනීම සඳහා ලිඛිතව දැනුම් දීමත්, අවශ්‍ය සහායන් ලබා දීමෙන් එම අවදානමෙන් මිදීමට අවශ්‍ය දැනුවත් කිරීම් හා සහාය ලබා දීම.
- දිස්ත්‍රික් මට්ටමේ හා පළාත් මට්ටමේ නිලධාරීන් දැනුවත් කිරීම මගින් නිරන්තර අවධානයක් මේ සඳහා යෙදවීමට ආයතන හා නිලධාරීන් යොමු කරවීම.
- ජනාධිපති විශේෂ ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය සහය හා සම්බන්ධීකරණය සිදු කිරීම.
- අධි අවදානම් තත්ත්වයන් ඇති වූ අවස්ථාවල මාධ්‍ය මගින් දැන්වීම් පළ කිරීම, රූපවාහිනී වැඩසටහන් සිදු කිරීම.
- මදුරුවන් බෝවන ස්ථාන නැති කිරීම සඳහා කසල අවම කිරීමට, කසල බඳුන් බෙදා දීමේදී මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් හා පාසල් කසල අවම කිරීමේ වැඩසටහන්වලදී අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කිරීම.
- ඩෙංගු මර්දන සති සම්බන්ධයෙන් සියලුම පළාත් පාලන ආයතන දැනුවත් කිරීම හා අවශ්‍ය සහය ලබා දෙන ලෙස දැන්වීම.
- ඩෙංගු රෝගය බෝවීම පාලනය කිරීමේ දී වඩා වැදගත් වන කාරණා සම්බන්ධයෙන් චක්‍ර ලේඛන හා උපදෙස් සැපයීම හා අවශ්‍යතාවය මත අතුරු ව්‍යවස්ථාවන් පනවා ගැනීමේ වැදගත්කම පෙන්වා දීම.




ආයතන සහ නිළධාරීන් දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම




ක්ෂේත්‍ර නිරීක්ෂණ අවස්ථා

## 6.3.4. මළාපවාහන පද්ධති කළමනාකරණය

මහකොළඹ අපජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් කොළඹ නගරයේ අපජල අපවහන පද්ධතිය නවීකරණය කිරීම මගින් නගරයේ සහ අවට නගරවල ජීවත්වන නගර වැසියන් සඳහා ක්‍රමවත් අපජල අපවහන පද්ධතියක් ලබාදීම තුළින් ඔවුන්ට ජීවත්වීම සඳහා උචිත සෞඛ්‍යසම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම.

### ප්‍රධාන ක්‍රියාකාරකම්

- කොළඹ මහනගරසභා බලප්‍රදේශය, දෙහිවල - ගල්කිස්ස මහනගරසභා සහ කොලොන්නාව නගරසභා බලප්‍රදේශයන්හි අපජල පොම්පාගාර නවීකරණය කිරීම.
- ධාරිතාවය අඩු හඳුනාගත් අපජල මාර්ග නවීකරණය කිරීම.
- අපජලය ගැඹුරු මුහුදට මුදාහරිනු ලබන ප්‍රධාන නළමාර්ගයන් නවීකරණය කිරීම.
- අපජල අපවහන පද්ධතිය නඩත්තු කිරීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ කොළඹ මහනගරසභා අපජල අපවහන අංශයට ලබාදීම
- කොළඹ මහනගරසභාවේ අපජල අංශයේ කාර්යය මණ්ඩලයේ ආයතනික හා හැකියා සංවර්ධනය

### 6.3.5. ප්‍රාදේශීය සභාවන්හි යන්ත්‍රෝපකරණ ඒකක පිහිටුවීම ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන)

සතිපොළ, කැළිකසල කළමනාකරණය, කාණු පද්ධති, අතුරු මාර්ග, ළමා උද්‍යාන, පොදු සනීපාරක්ෂක හා වැසිකිළි පහසුකම් වැනි ප්‍රජා යටිතල පහසුකම් නඩත්තු කිරීමට ප්‍රමාණවත් ආදායමක් උත්පාදනය නොකරන ප්‍රාදේශීය සභාවන්හි සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම අරමුණු කර ගනිමින් එම සභාවල යන්ත්‍රෝපකරණ ඒකක පිහිටුවීමට ක්‍රියා කෙරිණි.

| | |
|---|---|
| ව්‍යාපෘති කාලය | : 2013-2017 |
| මුළු පිරිවැය | : රු. මි. 11,200 |
| 2014 වර්ෂාවසනායට සමුච්ඡිත වියදම | : රු.මි. 2610 |
| 2015 වසර සඳහා වෙන් කළ ප්‍රතිපාදන | : රු.මි. 3330.0 |
| 2015 වසරේ වියදම | : රු. මි. 2869.94 |
| භෞතික ප්‍රගතිය | : 100% |

ප්‍රාදේශීය සභාවන්හි අත්‍යවශ්‍ය ප්‍රජා යටිතල පහසුකම් නඩත්තු කිරීම සඳහා ස්ථාපිත කෙරුණු එම ඒකක සඳහා සැපයෙන යන්ත්‍රෝපකරණ පහත සඳහන්වේ.

- Backhoe Loader 4WD
- Vibrating Roller 8 Ton
- Motor Grader 100 hp
- Dump truck (Tipper)- 7 Ton
- Truck Mounted Water Bowser (6000L)
- Crew Cab Long Wheel Base
- Crew Cab Short Wheel Base
- Tractors
- Road sweeper 7 Top
- Truck Mounted ladder 12 m
- Skid Loader 0'5 m3
- Walking Steel Roller 700 Kg

### 6.3.6. ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම (පුනරාවර්තන)

**"ප්‍රාදේශීය සභා නඩත්තු ඒකක මගින් ප්‍රජා යටිතල පහසුකම් නඩත්තු කිරීම සඳහා සෑම ප්‍රාදේශීය සභාවකටම මසකට රු. 1,000,000.00 බැගින් ලබාදීම."**

ප්‍රමාණවත් ආදායම් මාර්ග නොමැති වීම නිසා ප්‍රජා යටිතල පහසුකම් වැඩිදියුණු වී නොමැති ප්‍රාදේශීය සභාවල එම පහසුකම් වැඩි දියුණු කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සහ එමගින් ජනතාවට ලබාදෙන සේවාවන්වල ගුණාත්මකභාවය හා ඵලදායී බව ඉහළ නැංවීම මෙහි මූලික පරමාර්ථය වේ. මෙම වැඩසටහන යටතේ පහත දැක්වෙන ක්ෂේත්‍රයන් ඔස්සේ ප්‍රජා යටිතල පහසුකම් නඩත්තු කිරීම, අලුත්වැඩියාව සහ පුනරුත්ථාපනය කිරීම යන කාර්යයන් සිදු කෙරේ.

1. සතිපොළ නඩත්තු කිරීම
2. කාණු පද්ධතිය නඩත්තු කිරීම
3. ළමා උද්‍යාන නඩත්තු කිරීම
4. අතුරු පාරවල් නඩත්තු කිරීම
5. පොදු වැසිකිළි සහ පොදු සනීපාරක්ෂක කටයුතු කිරීම
6. කැළි කසල කළමනාකරණය
7. යන්ත්‍ර උපකරණ නඩත්තුව
8. ප්‍රජා ජල ව්‍යාපෘති නඩත්තු කිරීම
9. රථගාල් නඩත්තු කිරීම
10. ජංගම වෙළඳාම විධිමත් කිරීම
11. ප්‍රාදේශීය සභා සතු ස්ථාවර වෙළඳ මධ්‍යස්ථාන විධිමත් කිරීම හා නඩත්තු කිරීම
12. නගර පිරිසිදු කිරීම හා අලංකරණය
13. බස් නැවතුම්පොළ විධිමත්ව පවත්වා ගැනීම
14. ආදාහනාගාර - සුසාන භූමි විධිමත්ව පවත්වා ගැනීම
15. ආයුර්වේද මධ්‍යස්ථාන සහ ළමා හා මාතෘ සායන විධිමත්ව පවත්වා ගැනීම

මේ වැඩසටහනට 2015 වර්ෂය සඳහා වෙන් කළ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 1400.0කි. එයින් වියදම් කළ මුදල රු. මි. 848.64ක් වන භෞතික ප්‍රගතිය 61%ක් විය. දිවයිනේ සියලුම ප්‍රාදේශීය සභා (271) ආවරණය වන පරිදි මේ වැඩසටහන ක්‍රියාත්මක විය.

## 6.3.7. පසුගාමී පළාත් පාලන ආයතන නගා සිටුවීම

අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන 10 ක් තෝරාගෙන විධිමත් පරිදි මහජන සේවා සැළසීමට හැකිවන අයුරින් එම පළාත් පාලන ආයතනවල ගොඩනැගිලි ඉදිකිරීම හා කාර්යාල උපකරණ මිලදී ගැනීමට 2015 වසර සඳහා රුපියල් මිලියන 30 ක ප්‍රතිපාදන වෙන් කෙරිණි. එයින් රු.මි. 25.3ක් එම වර්ෂය තුළ වියදම් කර ඇති අතර සමස්ත භෞතික ප්‍රගතිය 100%කි.

**2015 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති**

| පළාත | දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතනය | ව්‍යාපෘතිය | 2015 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු.මි | 2015.12.31 දිනට වියදම රු.මි | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|
| උතුරු-මැද | අනුරාධපුරය | මිහින්තලේ ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම | 4.0 | 3.52 | 100 |
| | | මැදවච්චිය ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල අලුත්වැඩියාව | 4.0 | 3.05 | 100 |
| | | හොරොව්පතාන ප්‍රාදේශීය සභාව | නව කාර්යාලයේ ඉහළ මහල සඳහා කාර්යාල උපකරණ මිලදී ගැනීම | 1.06 | 1.06 | 100 |
| මධ්‍යම | මහනුවර | හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභා කාර්යාල උපකරණ මිලදී ගැනීම | 0.5 | 0.54 | 100 |
| | | ගඟවටකොරලේ ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම | 7.0 | 6.3 | 100 |
| සබරගමුව | රත්නපුර | ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | 2.5 | 1.63 | 100 |
| වයඹ | කුරුණෑගල | පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභා දෙමහල් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 4.0 | 3.6 | 100 |
| ඌව | බදුල්ල | මහියංගණ ප්‍රාදේශීය සභාව | කාර්යාල උපකරණ මිලදී ගැනීම | 2.0 | 2.0 | 100 |
| | | | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම | 5.0 | 3.53 | 100 |
| | | | | **30.0** | **25.23** | **100** |

### 6.3.8. ආපදා ප්‍රතිචාර ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අදියර III

| | |
|---|---|
| ව්‍යාපෘති කාලය | : 2014-2016 |
| මුළු පිරිවැය | : රු. මි. 1700.0 |
| 2015 වසර සඳහා වෙන් කළ ප්‍රතිපාදන | : රු.මි. 300.0 |
| 2014 වර්ෂාවසනායට සමුච්ඡිත වියදම | : රු.මි. 204.37 |
| 2015 වසරේ වියදම | : රු. මි. 101.74 |
| භෞතික ප්‍රගතිය | : 50% |

**ගිනි නිවීමේ ඒකක ස්ථාපිත කිරීම**

නෙදර්ලන්ත ණය අරමුදල් මත ක්‍රියාත්මක කර අවසන් කර ඇති හදිසි ආපදා ප්‍රතිචාර ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අදියර I හා II යටතේ පළාත් පාලන ආයතන වෙත ලබාදෙන ලද සහායට අමතරව 2015 වසර තුළ ද යාපනය, මඩකලපුව, අක්කරෙයිපත්තු, මාතලේ හා අම්පාර යන පළාත් පාලන ආයතනවලට ගිනි නිවීමේ යන්ත්‍රෝපකරණ ලබා දීමටත් අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමටත් කටයුතු කෙරිණි.

### 6.3.9. පළාත් පාලන ආයතන සතු වාහන අලුත්වැඩියා කිරීම

වඩාත් ඵලදායී මහජන සේවාවන් කාර්යක්ෂමව සැපයීම අරමුණු කොට ගෙන හම්බන්තොට මහනගර සභාව හා අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව යන පළාත් පාලන ආයතනවල වසර 10 කට වඩා පැරණි ඉතාමත් අබලන් තත්වයේ පවතින ඩබල් කැබ්රථ ඇතුළු වාහන අලුත්වැඩියා කිරීම සඳහා 2015 වසර තුළ කටයුතු කර ඇත.

| | |
|---|---|
| 2015 වර්ෂයට වෙන් කළ ප්‍රතිපාදන | : රු.මි. 25.00 |
| 2015 වර්ෂාවසානයට වියදම් කළ ප්‍රමාණය | : රු.මි. 16.97 |
| භෞතික ප්‍රගතිය | : 80% |

## 6.4 පළාත් සභා සඳහා සහාය සේවා සම්පාදනය කිරීම

### 6.4.1. පළාත් සභා සඳහා මූල්‍ය ප්‍රදාන

රජය විසින් මෙම අමාත්‍යාංශය හරහා පළාත් සභා සඳහා වාර්ෂිකව තුන් වැදෑරුම් ප්‍රදානයන් ලබාදෙනු ලැබේ. එනම් - උපමාන පාදක ප්‍රදාන, අනුරූපිත ප්‍රදාන සහ පළාත් කාර්යය නිශ්චිත සංවර්ධන ප්‍රදාන යනුවෙනි. මෙම ප්‍රදානයන් සඳහා අවශ්‍ය මූල්‍යප්‍රතිපාදන පළාත් සභාවල සහ අමාත්‍යාංශයේ වාර්ෂික ඇස්තමේන්තුවලට ඇතුළත් කෙරේ. මෙලෙස ලබාදෙන ප්‍රදාන පළාත් සභා විසින් ස්වකීය වාර්ෂික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා උපයෝගී කරගනු ලැබේ.

## මධ්‍යම රජයේ ප්‍රදාන හා එම ප්‍රදාන මුදා හැරීම්

(රු.මි)

| ප්‍රදාන වර්ගය | 2013 | | | 2014 | | | 2015 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | සත්‍ය | % | ඇස්තමේන්තුව | සත්‍ය | % | ඇස්තමේන්තුව | 2015.12.31 දිනට මුදා හැරීම්* | % |
| **පුනරාවර්තන ප්‍රදාන**<br>සාමූහික ප්‍රදාන | 108,802.0 | 108,802.0 | 100 | 126,144.0 | 126,144.0 | 100 | 167,556.0 | 167,484.0 | 100 |
| a. මුළු පුනරාවර්තන ප්‍රදාන | **108,802.0** | **108,802.0** | **100** | **126,144.0** | **126,144.0** | **100** | **167,556.0** | **167,484.0** | **100** |
| **ප්‍රාග්ධන ප්‍රදාන**<br>උපමාන පාදක ප්‍රදාන | 3,513.0 | 2,284.0 | 65 | 3,875.0 | 2,180.0 | 56 | 3,785.0 | 3,753.0 | 997 |
| පළාත් කාර්යය නිශ්චිත සංවර්ධන ප්‍රදාන* | 10,820.0 | 6,905.0 | 64 | 12,921.0 | 9,255.0 | 72 | 14,977.0 | 13,845.0 | 92 |
| b. **මුළු ප්‍රාග්ධන ප්‍රදාන** | **14,333.0** | **9,189.0** | **70** | **16,796.0** | **11,435.0** | **68** | **18,762.0** | **17,598.0** | **94** |
| **මුළු ප්‍රදාන (a+b)** | **123,135.0** | **117,991.0** | **96** | **142,940.0** | **137,579.0** | **96** | **186,318.0** | **185,082.0** | **99** |

## පළාත් සභා මුළු ආදායම

(රු.මි)

| ආදායම් වර්ගය | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | සත්‍ය | ඇස්තමේන්තුව | සත්‍ය | ඇස්තමේන්තුව | 2015.12.31 දිනට සත්‍ය ආදායම |
| පිරිවැටුම් බදු | 81.0 | 117.0 | 73.5 | 298.0 | 120.0 | 448.20 |
| වාහන බලපත්‍ර ගාස්තු | 5,090.0 | 6,588.0 | 6,497.0 | 7,481.0 | 7,410.0 | 8,711.90 |
| මත්පැන් බලපත්‍ර ගාස්තු | 756.0 | 835.0 | 965.0 | 942.0 | 835.0 | 1,819.90 |
| පොළී | 1,183.0 | 1,884.0 | 1,387.0 | 1,409.0 | 1,054.0 | 1,197.90 |
| උසාවි දඩ | 1,621.0 | 1,891.0 | 2,033.0 | 1,841.0 | 1,882.0 | 1,971.30 |
| මුද්දර ගාස්තු | 7,636.0 | 6,678.0 | 8,290.0 | 7,567.0 | 10,051.0 | 26,834.90 |
| අනෙකුත් | 42,265.0 | 31,655.0 | 41,247.5 | 39,596.0 | 45,476.0 | 26,189.20 |
| මුළු ආදායම | **58,632.0** | **49,648.0** | **60,493.0** | **59,134.0** | **66,828.0** | **67,173.30** |

පළාත් සභාවන්හි පුනරාවර්තන හා ප්‍රග්ධන වියදම් (රු.මි)

| වියදමේ ස්වභාවය | 2013 | | | 2014 | | | 2015 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්ත මේන්තුව | සත්‍ය | % | ඇස්ත මේන්තුව | සත්‍ය | % | ඇස්ත මේන්තුව | 2015.12.31 දිනට සත්‍ය වියදම්* | % |
| a. **පුනරාවර්තන වියදම** | **162,897.0** | **154,137.0** | **95** | **179,149.0** | **172,131.0** | **96** | **228,373.0** | **222,223.0** | **97** |
| ප්‍රාග්ධන වියදම | | | | | | | | | |
| **උපමාන පාදක ප්‍රදාන** යටතේ වියදම | 10,187.0 | 8,030.0 | 79 | 3,004.0 | 0,249.0 | 79 | 9,681.0 | 7,337.0 | 76 |
| **පළාත් කාර්යය නිශ්චිත සංවර්ධන** ප්‍රදාන ** | 10,770.0 | 8,637.0 | 80 | 15,629.0 | 11,662.0 | 75 | 15,629.0 | 12,845.0 | 82 |
| b. **ප්‍රාග්ධන වියදම් එකතුව** | **16,780.0** | **16,667.0** | **99** | **28,633.0** | **21,911.0** | **77** | **25,310.0** | **20,182.0** | **80** |
| **මුළු එකතුව** (a+b) | **174,327.0** | **170,804.0** | **98** | **207,782.0** | **194,042.0** | **93** | **253,683.0** | **242,405.0** | **96** |

** පළාත් කාර්යය නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අධ්‍යාපනය හා සෞඛ්‍ය වැඩිදියුණු කිරීමේ ප්‍රදාන ද ඇතුළත් වේ.

## 6.4.2. පළාත් පාලන ආයතන සතු පුස්තකාල සංවර්ධනය

දිවයිනේ පළාත් පාලන ආයතන සතු අඩු පහසුකම් සහිත මහජන පුස්තකාල සංවර්ධනය කිරීම වෙනුවෙන් මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ 2015 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 19.0කි. පවතින ප්‍රතිපාදන සැළකිල්ලට ගනිමින් ප්‍රමුඛතාවය මත අඩු පහසුකම් සහිත අත්‍යාවශ්‍යයෙන්ම දියුණුකළ යුතු පුස්තකාල පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය මත තෝරා ගෙන එම පුස්තකාල සඳහා පොත්පත් ලබා දීම, කාර්යාලීය ලී බඩු සහ උපකරණ ලබාදීම, පරිගණක හා උපාංග ලබා දීම, සීඩීපට ලබාදීම හා පුස්තකාලවල අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදුකිරීම වැනි කාර්යයන් මෙම වැඩසටහන මගින් ක්‍රියාත්මක කරන ලදී.

2015 වර්ෂයට වෙන් කළ ප්‍රතිපාදන : රු.මි. 19.03

2015 වර්ෂාවසානයට වියදම් කළ ප්‍රමාණය : රු.මි. 16.47

භෞතික ප්‍රගතිය : 86%

## 2015 ප්‍රගතිය

### 2015 ක්‍රියාත්මක කළ පුස්තකාල සංවර්ධන කාර්යයන්

| පළාත | පළාත් පාලන ආයතන පුස්තකාලය | කාර්යය | වියදම රු.මි. |
|---|---|---|---|
| නැගෙනහිර | 1. අක්කරපත්තුව මහ නගර සභා පුස්තකාලය | පුස්තකාලය සඳහා ලී බඩු ලබා දීම | 9.54 |
| | 2. එරාවූර් නගර සභා පුස්තකාලය | පරිගණක සහ පුස්තකාල උපකරණ ලබාදීම | 1.12 |
| | 3. නාමල් ඔය ප්‍රාදේශීය සභා පරගහ කැලේ පුස්තකාලය | පුස්තකාල උපකරණ ලබාදීම | 0.74 |
| | 4. මහඔය ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලය | පුස්තකාල උපකරණ ලබාදීම | 0.28 |
| මධ්‍යම | 1. ගම්පොල නගර සභා පුස්තකාලය | පරිගණක සහ පුස්තකාල උපකරණ ලබා දීම | 1.13 |
| | 2. අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා පුස්තකාලය | පුස්තකාල උපකරණ ලබා දීම | 0.6 |
| | 3. උඩුදුම්බර ප්‍රාදේශීය සභා පුස්තාකලය | පුස්තකාල උපකරණ ලබාදීම | 0.7 |
| සබරගමුව | අරණායක ප්‍රාදේශීය සභා පුස්තකාලය | පුස්තකාල උපකරණ ලබා දීම | 0.54 |
| ඌව | කන්දෙකැටිය ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලය | පුස්තකාල උපකරණ ලබාදීම | 0.33 |
| උතුරු මැද | 1. ගෝනපතිරාව මහජන පුස්තකාලය | පුස්තකාල උපකරණ ලබාදීම | 0.10 |
| | 2. කහටගස්දිගිළිය ප්‍රාදේශීය සභා පුස්තකාලය | පුස්තකාල උපකරණ ලබාදීම | 0.19 |
| | 3. වැලිකන්ද ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලය | පුස්තකාල උපකරණ ලබාදීම | 0.10 |
| උතුරු | 1. කරනගර් ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලය | පොත්පත් සහ පුස්තකාල උපකරණ ලබාදීම | 0.70 |
| | 2. නනත්තන් මහජන පුස්තාකලය නනත්තන් ප්‍රාදේශීය සභාව | පොත්පත් සහ පුස්තකාල උපකරණ ලබාදීම | 0.4 |
| | | | 16.47 |

මේ අතර දැනට ක්‍රියාත්මක මහජන පුස්තකාලවලට අනුබද්ධිතව විද්‍යුත් පුස්තකාල (E-Library) ස්ථාපනය කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ අතර මෙම වැඩසටහන සඳහා වූ යෝජනා විශාල ප්‍රමාණයක් මෙම අමාත්‍යාංශය වෙත ලැබී ඇත.



විද්‍යුත් පුස්තකාලය - කුලියාපිටිය නගර සභාව

## 6.5 සමතුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම

### 6.5.1. කුඩා හා මධ්‍ය පරිමාණ නගර සංවර්ධනය

නාගරික සංවර්ධන අධිකාරියේ, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහ උපදේශාත්මක සහාය ඇතිව පළාත් සභාවල ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තු, පළාත් පාලන කොමසාරිස් කාර්යාල මැදිහත් වීම ඇතිව කුඩා හා මධ්‍ය පරිමාණ නගර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශයේ සංවර්ධන ක්‍රියාදාමය තුළ කැපී පෙනෙන නව අංගයක් බවට පත් වී ඇත.

| නගර සංවර්ධන වැඩසටහන | ව්‍යාපෘති කාලය | මුළු ඇස්තමේන්තුව රු.මි. | 2015 වසරට අනුමත මුදල (රු.මි) | වියදම |
|---|---|---|---|---|
| හක්මන නගර සංවර්ධන වැඩසටහන | 2008-2015 | 444.0 | 50.0 | 18.72 |
| හොරණ නගර සංවර්ධන වැඩසටහන | 2011-2015 | 350.0 | 40.0 | 28.11 |
| දෙහිඕවිට නගර සංවර්ධන වැඩසටහන | 20100-2015 | 700.0 | 90.0 | 39.73 |
| පල්ලෙපොල නගර සංවර්ධන වැඩසටහන | 20100-2016 | 350.0 | 40.0 | 3.0 |
| අක්කරෙයිපත්තු නගර සංවර්ධන වැඩසටහන | 2011-2015 | 525.0 | 125.0 | 14.2 |
| පඬුවස්නුවර නගර සංවර්ධන වැඩසටහන | 2011-2015 | 265.0 | 80.0 | 12.0 |



හොරණ මහජන ක්‍රීඩාංගණය ඉදිකිරීම - රු.මි.8.6



අක්කරෙයිපත්තු මහ නගර සභා
ගොඩනැගිල්ල ඉදිකිරීම -රු.මි.19.2



හක්මණ මහජන පුස්තකාලය ඉදිකිරීම - රු.මි.41.7



හක්මණ නගර ශාලාව ඉදිකිරීම රු.මි. 68.7



දෙහිඕවිට බහුකාර්ය සංකීර්ණය ඉදිකිරීම - රු.මි.262.5



පඬුවස්නුවර බස්නැවතුම්පොළ සහ
වෙළඳ සංකීර්ණය ඉදිකිරීම රු.මි.31.4

## 6.5.2. ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති


### 6.5.2.1. පුර නැගුම - පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නගා සිටුවීමේ ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| **ණය ආධාර ලබාදෙන ආයතනය** | : | ආසියානු සංවර්ධන බැංකුව |
| **ව්‍යාපෘති අරමුණු** | : | පළාත් පාලන ආයතන ක්‍රියාකාරකම් ප්‍රතිනිර්මාණය කිරීම සහ පසුගාමී පළාත් පාලන ආයතන බලප්‍රදේශ 108 ක් තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම |
| **ව්‍යාපෘති පිරිවැය** | : | රු. මිලියන 8,596.0 |
| **ව්‍යාපෘති කාලය** | : | 2012-2016 |

මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලද පළාත් පාලන ආයතන 108 තුළ උප ව්‍යාපෘති 184ක් ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා 2015 වර්ෂයට වෙන් කළ මුදල රු.මි. 2780කි. 2015 වියදම රු.මි. 2564.0 ක් වන අතර භෞතික ප්‍රගතිය 100% ක් වේ.

**ක්‍රියාත්මක ප්‍රදේශ**

බස්නාහිර, වයඹ, දකුණ, සබරගමුව, ඌව, මධ්‍යම, උතුරු මැද යන පළාත්



මේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කෙරෙන උප ව්‍යාපෘති පහත දැක්වේ.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ඝන අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘති | 5 |
| 02 | ජල සම්පාදන ව්‍යාපෘති | 22 |
| 03 | පහසු මධ්‍යස්ථාන ඉදිකිරීම | 36 |
| 04 | සනීපාරක්ෂක උපකරණ බෙදාදීම | 3 |
| 05 | කාණු ඉදිකිරීම | 4 |
| 06 | ඝන අපද්‍රව්‍ය කළමණාකරණයට උපකරණ ලබා දීම | 45 |
| 07 | ප්‍රාදේශීය සභා මාර්ග ඉදි කිරීම (සභා 15) | 20.6 (කි.මී) |
| 08 | පාලම් ඉදි කිරීම | 2 |
| 09 | බස් නැවතුම්පොළ ඉදිකිරීම | 15 |
| 10 | ත්‍රී වීලර් රථ ගාල් ඉදි කිරීම | 5 |
| 11 | ප්‍රාදේශීය සභා සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදිකිරීම | 32 |
| 12 | මාතෘ සායන මධ්‍යස්ථාන ඉදි කිරීම | 6 |
| 13 | මහජන වෙළඳපොළ ඉදි කිරීම | 45 |
| 14 | පරිගණක හා මානව සම්පත් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම | 4 |
| 15 | පෙර පාසල් / දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදි කිරීම | 19 |
| 16 | ළමා උද්‍යාන ඉදි කිරීම | 8 |
| 17 | ආදාහනාගාර ඉදි කිරීම | 3 |
| 18 | පළාත් පාලන ආයතනවල කාර්යාල ගොඩනැගිලි ඉදි කිරීම | 43 |
| 19 | පළාත් පාලන ආයතන මහජන පුස්තකාල ඉදිකිරීම | 43 |
| 20 | ශ්‍රවනාගාර / ප්‍රජා ශාලා ඉදි කිරීම | 43 |
| 21 | ජල බවුසර් ලබාදීම | 6 |


මීට අමතරව ප්‍රාදේශීය සභා මගින් සපයන සේවාවන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් ඉටු කිරීමට හැකිවන පරිදි එම ආයතන යටතේ පාලනය වන යටිතල පහසුකම් ක්ෂේත්‍ර වැඩි දියුණු කිරීම, වරිපනම් ඇතුළු අනෙකුත් බදු අය කිරීමේ හා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාපටිපාටි සරල කිරීම හා ඒවා අනුමත කිරීමේ ක්‍රමවේදය වඩාත් විනිවිදභාවයකින් ඉටුකිරීමට හැකි වන පරිදි ප්‍රාදේශීය සභාවන්හි ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීමත් මෙන්ම පළාත් පාලන ආයතන සඳහා යන්ත්‍රෝපකරණ බෙදා දීමත් සිදු කෙරිණි.



වලල්ලාවිට
සතිපොළ



කිරින්ද
බස්නැවතුම්පල



හුළුගඟ
පාලම



විල්ගමුව
ප්‍රාදේශීය
සභා
ගොඩනැගිල්ල

### 6.5.2.2. පළාත් මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - මධ්‍යම හා සබරගමුව පළාත්

| | |
|---|---|
| **ණය ආධාර ලබාදෙනු ලබන ආයතනය** | : ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA) |
| **ව්‍යාපෘති අරමුණු** | : පළාත් මාර්ග (C සහ D පංතියේ මාර්ග) පුනරුත්ථාපනය කිරීම සහ සේවා තත්ත්වය උසස් කිරීම මගින් විශ්වසනීය මාර්ග ජාලයක් ඇති කිරීම හා එමගින් දේශිය ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වය සැපයීම හා ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම සහ පළාත් සභාවල මාර්ග සම්බන්ධ ආයතනවල සහ මාර්ග කොන්ත්‍රාත්කරුවන්ගේ හැකියාවන් වර්ධනය කිරීම |
| **ව්‍යාපෘති පිරිවැය** | : රු.මිලියන 14,212 |
| **ව්‍යාපෘති කාලය** | : 2010-2015 |
| **ව්‍යාපෘති ප්‍රදේශය** | : සබරගමුව පළාත (කි.මී. 138.00<br>මධ්‍යම පළාත (කි.මී. 164.00) |

- මෙම ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයට වෙන් කළ ප්‍රතිපාදන රු. මි. 2964.43ක් වන අතර වියදම රු.මි. 3,406.07 ක් වේ. සමස්ත භෞතික ප්‍රගතිය 99% කි.


**ක්‍රියාත්මක ප්‍රදේශ**



*පල්ලෙබැද්ද-බුළුතොට මාර්ගය*



*වල්පැලගොල්ල-කොබ්බෑකඩුව මාර්ගය*



## 6.5.2.3. පළාත් මාර්ග ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| ණය ආධාර ලබාදෙන ආයතනය | : | ලෝක බැංකුව |
| ව්‍යාපෘති අරමුණු | : | ඌව පළාත, නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කය හා උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කය තුළ සමාජීය සහ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමෙන් එම පළාත්වල ස්වයංපෝෂිත ආර්ථික රටාව වැඩිදියුණු කිරීම |
| ව්‍යාපෘති පිරිවැය | : | රු. මිලියන 12,053.00 |
| ව්‍යාපෘති කාලය | : | 2010-2015 |

- මෙම ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයට වෙන් කළ ප්‍රතිපාදන රු.මි. 2382.50ක් වන අතර එම වර්ෂය තුළ වියදම රු.මි. 1371.91කි. ව්‍යාපෘතිය මගින් උතුරු, නැගෙනහිර සහ ඌව පළාත්වල සංවර්ධනය කරන ලද පළාත් මාර්ගවල මුළු දිග මාර්ග ප්‍රමාණය කි.මි. සංඛ්‍යාව 233කි.


### ක්‍රියාත්මක ප්‍රදේශ



*ඌව පළාත් කෝට්ටෙගොඩ - මස්පන්න යාලගමුව මාර්ගය*



*උතුරු පළාත තිරුණවෙලි පුතුර් මාර්ගය*



### 6.5.2.4. උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය (ආරම්භක)

| | | |
|---|---|---|
| ණය ආධාර සපයන ආයතනය | : | ආසියානු සංවර්ධන බැංකුව |
| ව්‍යාපෘති අරමුණු | : | උතුරු පළාත තුළ වව්නියාව සහ මන්නාරම දිස්ත්‍රික්ක දෙකෙහි මාර්ග ජාලය වැඩිදියුණු කිරීම මගින් පළාත තුළ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සහ උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම. |
| ව්‍යාපෘති පිරිවැය | : | රු.මිලියන 2700.48 |
| ව්‍යාපෘති කාලය | : | 2010 - 2016 |

- 2015 සඳහා රු.මි. 455.81ක ප්‍රතිපාදන වෙන් කෙරුණු අතර ඉන් වර්ෂාවසානයට වියදම් කළ ප්‍රමාණය රු.මි.337.78කි. ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 84% කි.


**ක්‍රියාත්මක ප්‍රදේශ**



*තේක්කවත්ත-පුලුළිය මාර්ගය*



*කෙන්නඩි මාර්ගය*



## 6.5.2.5. උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය (අතිරේක ප්‍රතිපාදන)

ණය ආධාර සපයන


| | | |
|---|---|---|
| ආයතනය | : | ආසියානු සංවර්ධන බැංකුව |
| ව්‍යාපෘති අරමුණු | : | උතුරු පළාත තුළ කිළිනොච්චිය සහ මුලතිව් දිස්ත්‍රික්ක දෙකෙහි සහ උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ මාර්ග ජාලය වැඩිදියුණු කිරීම මගින් පළාත තුළ අභ්‍යන්තර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සහ පළාත් මාර්ග සංවර්ධන ආයතනයන් ශක්තිමත් කිරීම. |
| ව්‍යාපෘති පිරිවැය | : | රු.මිලියන 3780.0 |
| ව්‍යාපෘති කාලය | : | 2013 - 2018 |

- මෙම ව්‍යාපෘතියට 2015 සඳහා රු.මි. 1334.8 ක් වෙන් කෙරුණු අතර වියදම රු.මි. 920.16 ක් විය. ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 82% ක් වන අතර සමස්ත මූල්‍ය ප්‍රගතිය 83% ක් වේ. මේ යටතේ මාර්ග කි.මී. 98ක පමණ වැඩ නිම කර ඇත.

### ක්‍රියාත්මක ප්‍රදේශ



*කැබිතිගොල්ලෑව හැඳගල මාර්ගය*






*ඔඩ්ඩුසුඩාන්-පුදුකුඩුඉරිප්පු මාතලාන් මාර්ගය*

### 6.5.2.6. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

**ණය ආධාර සපයන ආයතනය** : ආසියානු සංවර්ධන බැංකුව(ADB)

**ව්‍යාපෘති අරමුණු** : කොළඹ නගරයේ අපජලපවාහන පද්ධතිය නවීකරණය කිරීම මගින් නගරයේ සහ අවට නගරවල ජීවත්වන නගර වැසියන් සඳහා ක්‍රමවත් අපජලපවාහන පද්ධතියක් ලබාදීම තුළින් ඔවුන්ට ජීවත්වීම සඳහා උචිත සෞඛ්‍යසම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම

**ප්‍රධාන ක්‍රියාකාරකම් :**

i. කොළඹ මහා නගර සභා බලප්‍රදේශය, දෙහිවල- ගල්කිස්ස මහ නගර සභා සහ කොලොන්නාව නගරසභා බලප්‍රදේශයන්හි අපජල පොම්පාගාර නවීකරණය කිරීම.

ii. ධාරිතාවය අඩු හඳුනාගත් අපජල මාර්ග නවීකරණය කිරීම.

iii. අපජලය ගැඹුරු මුහුදට මුදාහරිනු ලබන ප්‍රධාන නළමාර්ගයන් නවීකරණය කිරීම.

iv. අපජලපවාහන පද්ධතිය නඩත්තු කිරීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ කොළඹ මහ නගර සභා අපජලපවාහන අංශයට ලබාදීම

v. කොළඹ මහ නගර සභාවේ අපජල අංශයේ කාර්යය මණ්ඩලයේ ආයතනික හා හැකියා සංවර්ධනය

**අපේක්ෂිත ප්‍රතිලාභ**

- අපජල කළමනාකරණ සේවය වැඩි දියුණු කිරීම මගින් ජීවත් වීමට සුදුසු නාගරික පරිසරයක් නිර්මාණය කිරීම.
- කොළඹ නගරය තුළ සහ තදාසන්න පෙදෙස් හි ජීවත් වන ජනතාවට සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම තුළින් යහපත් ජීවන තත්ත්වයක් ලබාදීම.
- සමුද්‍රීය සහ ගොඩබිම් ජලයේ තත්ත්වය උසස් කිරීම.

**ව්‍යාපෘති පිරිවැය** : රු. මිලියන 12,171.00

**ව්‍යාපෘති කාලය** : 2010 - 2017

**ව්‍යාපෘති ප්‍රදේශය** : කොළඹ මහනගර සභා බලප්‍රදේශය


- මෙම ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයට වෙන් කළ ප්‍රතිපාදන රු.මි. 3041ක් වන අතර වර්ෂය තුළ වියදම 3031.52කි. සමස්ත භෞතික ප්‍රගතිය 85% ක් ලෙස වාර්තා වේ.

## ක්‍රියාත්මක ප්‍රදේශ





අපජල පවාහන පද්ධතිය නවීකරණය කිරීම








මෝදර මුහුදට අපජලය මුදාහරින ප්‍රධාන නලය ප්‍රතිසංස්කරණය

## 6.5.2.7. දැනුම් කේන්ද්‍රයේ පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය පරිණාමනය කිරීමේ ව්‍යාපෘතිය

**ණය ආධාර සපයන ආයතනය** : ලෝක බැංකුව

**ව්‍යාපෘති අරමුණු** : දැනුම පාදක කරගත් ආර්ථික හා සමාජීය සංවර්ධනයේ පදනම ලෙස ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය කෙරෙහි වූ ප්‍රවේශය හා එහි ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම

**ව්‍යාපෘති ක්‍රියාකාරකම්** :


- ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය කෙරෙහි වූ ප්‍රවේශය පුළුල් කිරීම
- අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම
- අධ්‍යාපන සේවා සැපයීම හා පරිපාලනය ශක්තිමත් කිරීම

**ව්‍යාපෘති පිරිවැය** : රු. මිලියන 13,000.00

**ව්‍යාපෘති කාලය** : 2012-2016

**ක්‍රියාත්මක ප්‍රදේශ**

සමස්ත දිවයින පුරා



- 2015 වර්ෂය සඳහා රු.මි. 3180.0ක් වෙන් කෙරුණු මෙම ව්‍යාපෘතියේ වර්ෂාවසානයට වියදම රු.මි. 2753.0 ක් වේ. සමස්ත භෞතික ප්‍රගතිය 86% කි. මෙම ව්‍යාපෘතිය යටතේ තාක්ෂණික විද්‍යාගාර 138ක් ඉදිකිරීම හා ඒවායේ රසායනාගාර සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම, පන්ති කාමර ගොඩනැගිලි 307ක් ඉදිකිරීම, කලාප අධ්‍යාපන කාර්යාල 13ක් හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාල 25ක් ඉදිකිරීම අවසන් කර ඇත. මීට අමතරව පාසල් පරිපාලනය පිළිබඳව විදුහල්පතිවරුන් හා ගුරුවරුන් පුහුණු කිරීම හා නිලධාරීන් සඳහා ප්‍රසම්පාදනය, මූල්‍ය කළමනාකරණය හා පාරිසරික කළමනාකරණය පිළිබඳව පළාත් සභාවල අධ්‍යාපන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නිලධාරීන්, කලාප හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම 2015 වර්ෂය තුළ සිදු කර ඇත.



*වලපනේ නව අධ්‍යාපන කාර්යාල ගොඩනැගිල්ල*




*වවුනියා උතුර කලාප අධ්‍යාපන කාර්යාලය*

## 6.5.2.8. ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| ණය ආධාර ලබාදෙන ආයතනය | : | කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) |
| අරමුණු | : | වාරිමාර්ග යටිතල පහසුකම් ඵලදායි හා තිරසාර කළමනාකරණයක් සඳහා දියුණු කිරීම සහ ජල හා භූමි ඵලදායිතාවය තිරසාර ලෙස දියුණු කිරීම |
| ව්‍යාපෘති ක්‍රියාකාරකම් | : | 1. යටිතල පහසුකම් සංවර්ධනය<br>a. වාර්මාර්ග පුනරුත්ථාපනය<br>b. අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය<br>2. නිෂ්පාදනය සහ අලෙවිකරණ කටයුතු ප්‍රවර්ධනය<br>3. ව්‍යාපෘති කළමනාකරණය |
| ව්‍යාපෘති පිරිවැය | : | රු. මිලියන 3,800.00 |
| ව්‍යාපෘති කාලය | : | 2012-2017 |
| ව්‍යාපෘති ප්‍රදේශය | : | කිලිනොච්චි දිස්ත්‍රික්කය - (වාරි මාර්ග කිලෝමීටර් 288) |

### ක්‍රියාත්මක ප්‍රදේශ




- 2015 වර්ෂය සඳහා රු.මි. 1000 ක් වෙන් කෙරුණු අතර වර්ෂාවසානයට වියදම රු.මි. 499.73කි. ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 88% කි.



පරන්තන් වම් ඉවුර ප්‍රධාන ඇළ මාර්ගය පිළිසකර කිරීම



පරන්තන් ප්‍රධාන ඇළ මාර්ගය හරහා පාලම ඉදිකිරීම


### 6.5.2.9. ද්විතීයික සෞඛ්‍ය ආංශික සංවර්ධන ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| ණය ආධාර ලබාදෙනු ආයතනය | : | ලෝක බැංකුව |
| ව්‍යාපෘති අරමුණු | : | පෝෂණය සහ බෝ නොවන රෝග සම්බන්ධයෙන් පැනනගින අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමට හැකිවන පරිදි මහජන සෞඛ්‍ය පහසුකම් නංවාලීම |
| ව්‍යාපෘති කාර්යයන් | : | ▪ මන්දපෝෂණය සඳහා විසඳුම් සෙවීම<br>▪ බෝනොවන රෝග වැළැක්වීම සහ පාලනය සඳහා කටයුතු කිරීම<br>▪ මාතෘ සහ ළමා සෞඛ්‍ය සඳහා කටයුතු කිරීම හා බෝවන රෝග වැළැක්වීමට කටයුතු කිරීම<br>▪ සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීම<br>▪ පුහුණු වැඩමුළු, පර්යේෂණ සහ සමීක්ෂණ |
| සමස්ත ව්‍යාපෘති පිරිවැය | : | රු. මිලියන 26,000.00<br>(ඇමරිකානු ඩොලර් මිලියන 200) |
| ව්‍යාපෘති කාලය | : | 2013 - 2016 |

**ක්‍රියාත්මක ප්‍රදේශ**

සමස්ත දිවයින පුරා

- 2015 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියට රු.මි. 3195.0ක් වෙන් කෙරිණි. වර්ෂාවසානය වන විට රු.මි.2222.0 ක් වැය කර ඇති අතර 97% ක සමස්ත භෞතික ප්‍රගතියක් පෙන්නුම් කරයි.



## 6.5.2.10. යාපනය-කිලිනොච්චි ජලසම්පාදන හා සනීපාරක්‍ෂක ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| ණය ආධාර ලබාදෙන ආයතනය | : | ආසියානු සංවර්ධන බැංකුව |
| ව්‍යාපෘති අරමුණු | : | යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල ජල සැපයුම් සේවා වැඩිදියුණු කිරීම, යාපනය මහ නගර සභා සීමාව තුළ ජනතාව සඳහා සනීපාරක්ෂක යටිතල පහසුකම් හා යාපනය අර්ධද්වීපයේ ජල සැපයුම් කළමනාකරණ වැඩසටහන් ශක්තිමත් කිරීම |
| ව්‍යාපෘති පිරිවැය | : | රු. මිලියන 1,744.00 |
| ව්‍යාපෘති කාලය | : | 2012-2016 |

- මෙම ව්‍යාපෘතියට අදාළව 2015 වර්ෂයට වෙන් කෙරුණු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 300.0ක් වන අතර රු.මි. 177.2ක් 2015 වර්ෂය තුළ වියදම් කර ඇත. සමස්ත භෞතික ප්‍රගතිය 67%කි.

### ක්‍රියාත්මක ප්‍රදේශ


යාපනය හා කිලිනොච්චිය දිස්ත්‍රික්ක




*ශීප් ෆුට් රෝල ආධාරයෙන් වැව් තාවුළුවලට අලුතින් පස් දමා තැලීම*



*පස් තැලීමෙන් පසු තත්ත්වය පරීක්ෂා කිරීම*



## 6.5.2.11. උතුරු-නැගෙනහිර පළාත් පාලන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (NELSIP)




**ණය ආධාර සපයන ආයතන :**
ලෝක බැංකුව, ඕස්ට්‍රේලියානු රජය හා ශ්‍රී ලංකා රජය

**ව්‍යාපෘති අරමුණු :**
උතුරු, නැගෙනහිර පළාත් සහ ඒවාට යාබද ව පිහිටි ඌව, වයඹ හා උතුරු මැද පළාත්වල පළාත් පාලන අයතනවලට ස්වකීය සේවාවන් හා ප්‍රාදේශීය යටිතල පහසුකම් වගකීම හා වගවීම සහිතව මහජනයා වෙත ලබාදීම සඳහා සහාය වීම.

**ව්‍යාපෘති පිරිවැය :**
**රු. මිලියන 13,007.50**

**ව්‍යාපෘති කාලය :**
2010 - 2016

**ව්‍යාපෘති ප්‍රදේශය :**
උතුරු හා නැගෙනහිර පළාත්වල සියලූ පළාත් පාලන ආයතන (79) හා උතුරු මැද, ඌව හා වයඹ යන පළාත්වල පාලන ආයතන පිළිවෙළින් 12, 3 හා 7 වශයෙන් පළාත් පාලන ආයතන 22ක් ද ඇතුළුව පළාත් පාලන ආයතන 101ක බලප්‍රදේශ ආවරණය වෙයි.

2010 වසරේ එවක පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව කටයුතු ආරම්භ කළ මෙම ව්‍යාපෘතියේ පළමු අදියර උතුරු හා නැගෙනහිර පළාත්වල සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පළාත් පාලන ආයතන 79 ක් සම්බන්ධ කොටගෙන ක්‍රියාත්මක විය. පළමු අදියරේ සාර්ථකත්වය මත ඒ පළාත්වලට යාබද පළාත් කරා ව්‍යාප්ත කරමින් ඕස්ට්‍රේලියානු රජයේ ප්‍රදාන මත මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර සැලසුම් කෙරිණි. එය ක්‍රියාත්මක කිරීම 2015 අප්‍රේල් මස 29 දින ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මෙම අමාත්‍යාංශය වෙත පැවරිණි.

### මුදල් මූලාශ්‍ර

| මුදල් මූලාශ්‍ර | වටිනාකම | |
|---|---|---|
| | ඇ. ඩො | රු. මි. |
| ජාත්‍යන්තර සහයෝගිතා අරමුදල (WB) | 70.00 | 8,700.00 |
| ඕස්ට්‍රේලියානු විදේශ කටයුතු හා වෙළෙඳ දෙපාර්තමේන්තුව (DFAT) (ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය) | 20.30 | 2,537.50 |
| ශ්‍රී ලංකා රජය | 14.00 | 1,550.00 |
| ප්‍රජා දායකත්වය | 2.00 | 220.00 |
| **මුළු මුදල** | **106.30** | **13,007.50** |

2015 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතියේ සමුච්ඡිත වියදම රු.මි. 9306.82 කි. උතුරු නැගෙනහිර පළාත්වල ව්‍යාපෘති 80ක් අනුමත කිරීමට හැකි වූ අතර සෙසු පළාත්වල ව්‍යාපෘති හඳුනාගැනීම, සැලසුම් සකස් කිරීම හා ඇස්තමේන්තු සකස් කිරීම යන කටයුතු සිදුවෙමින් පැවතිණි. 2015 සඳහා රු.මි. 2,242 ක් වෙන් කෙරුණු අතර වියදම රු.මි. 429 කි.



අඩ්ඩාලච්චෙනෙයි වෙළෙඳ සංකීර්ණය



ළමා උද්‍යානය - කින්නියා



මන්මුනායි අර්යම්පති ප්‍රා.ස. ගොඩනැගිල්ල




ඊරුකලම්පිට්ටි ජලසම්පාදන යෝජනා ක්‍රමය

## 6.5.2.12. ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| ණය ආධාර සපයන ආයතනය | : | එක්සත් රාජධානිය හා නෙදර්ලන්තය |
| ව්‍යාපෘති අරමුණු | : | 1. රටේ ජාතික ආර්ථික වර්ධනය අරමුණු කරගනිමින් ජනතාවගේ සංචලනය සහ ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම<br>2. ග්‍රාමීය ජනතාවගේ පොදු සුරක්ෂිත බව වර්ධනය කිරීම<br>3. ග්‍රාමීය ප්‍රදේශවල මෙතෙක් භාවිතයට නොගත් සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම මෙන්ම ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් නව නිෂ්පාදන අවස්ථා සඳහා ඔවුන්ගේ දේශීය දැනුම භාවිතයට ගැනීම |
| ව්‍යාපෘති පිරිවැය | : | අදියර 1-රු. මිලියන 6,843.0<br>අදියර 11-රු. මිලියන 20,000.0<br>අදියර 111-රු. මිලියන 18,600.0 |
| ව්‍යාපෘති කාලය | : | 2013 - 2017 |
| ව්‍යාපෘති ප්‍රදේශය | : | මුළු දිවයින ආවරණය කෙරේ. |

### ක්‍රියාත්මක ප්‍රදේශ

සමස්ත දිවයින පුරා



## ප්‍රගතිය (2013-2015)

| අදියර | මූල්‍ය සහාය | මුළු පිරිවැය | 2015 සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු.මි. | ඉදිකෙරෙන පාලම් ගණන | වැඩ නිමි සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (2015) රු.මි. | සමස්ත මූල්‍ය ප්‍රගතිය රු.මි. |
|---|---|---|---|---|---|---|---|
| I | එක්සත් රාජධානිය | 6,843.00 | 2628.00 | 210 | 202 | 2628.0 | 6,843.00 |
| II | එක්සත් රාජධානිය | 20,000.00 | 3,937.00 | 537 | 45 | 7973.0 | 2,000.00 |
| III | නෙදර්ලන්තය | 18,600.00 | 5,129.00 | 463 | 4 | 3535.8 | 18,600.00 |
| | **එකතුව** | **45,443.00** | **11694.00** | **1210** | **251** | **14136.8** | **27,443.00** |


පෙර තත්ත්වය


පසු තත්ත්වය

එපිටමුල්ල පාලම-මාතලේ දිස්ත්‍රික්කය


පෙර තත්ත්වය


පසු තත්ත්වය

ගල්කඩුල්ල පාලම-මාතලේ දිස්ත්‍රික්කය

## 6.5.2.13. දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන සඳහා යුරෝපා සංගම් සහාය

| | | |
|---|---|---|
| **අරමුදල් සපයන ආයතනය** | : | යුරෝපා සංගමය |
| **ක්‍රියාත්මක කරන ආයතන** | : | UNDP, UNICEF, UNOPS, FAO, ILO සහ ලෝක බැංකු සමූහයේ සාමාජිකත්වය දරන IFC |
| **ව්‍යාපෘති පිරිවැය** | : | රු.මි. 8955.00 |
| **ව්‍යාපෘති කාලය** | : | 2012-2017 |
| **ව්‍යාපෘති ප්‍රදේශය** | : | අම්පාර, අනුරාධපුර, මඩකලපුව, මන්නාරම, මොණරාගල, පුත්තලම හා වවුනියාව දිස්ත්‍රික්ක. |

**2015 වර්ෂය තුළ ඉටු කළ කාර්යයන්**

| ක්‍රියාත්මක කරන ආයතනය | දිස්ත්‍රික්ක | ක්‍රියාකාරකම් | කාර්යසාධනය |
|---|---|---|---|
| **එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)** | අම්පාර, අනුරාධපුරය, මඩකලපුව, මන්නාරම, මොණරාගල, පුත්තලම හා වවුනියාව | ආදායම් උත්පාදනය වැඩි කිරීමට සහාය දීම | ▪ ප්‍රතිලාභීන් 1409 දෙනෙකු හඳුනාගැනීම<br>▪ 776 දෙනෙකුට තාක්ෂණික නිපුණතා හා ව්‍යවසායකත්ව පුහුණුව ලබාදීම<br>▪ සංවර්ධන නිලධාරීන් 223 දෙනෙකු ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන සම්පූර්ණ කිරීම |
| **එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)** | අනුරාධපුර, මඩකලපුව, මන්නාරම, මොණරාගල, පුත්තලම හා වවුනියාව | නිෂ්පාදනය වැඩි කිරීම, පශ්චාත් අස්වනු තාක්ෂණය හා විවිධාංගීකරණය | වී හා තල් වගාව, ධීවර කර්මාන්තය, ආහාර සැකසීම, කොහු ආශ්‍රිත නිෂ්පාදන, සුලු ව්‍යාපාර යන අංශවල නිෂ්පාදක කණ්ඩායම් 90 කින් 13කට තාක්ෂණික නිපුණතා හා ව්‍යාපාර සැලසුම් සංවර්ධන පුහුණුව ලබාදීම |
| | | යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ සේවාවන්ට සහාය දීම | ▪ යටිතල පහසුකම් අඩවි 82ක් හඳුනා ගැනීම හා ඉන් 50%ක ඉදිකිරීම් ආරම්භ කිරීම.<br>▪ මෙයින් අඩවි 38ක වැඩ 2015 වර්ෂය තුළ නිම කිරීමට නියමිතය. |
| | | ප්‍රාදේශීය නිෂ්පාදක සංවිධානවල හැකියාවන් ශක්තිමත් කිරීම | නිෂ්පාදක සංවිධාන 37ක් සම්බන්ධ කරගැනීම |
| | | දිස්ත්‍රික්/ප්‍රාදේශීය මට්ටමේ පාර්ශ්වකරුවන්ගේ සංවර්ධන සැලසුම්කරණ හා | ▪ පුහුණුකරුවන් 38ක් හා නිලධාරීන් 950 දෙනෙකුට සැලසුම්කරණය හා පසු විපරම් පිළිබඳ පුහුණුව ලබාදීම<br>▪ ප්‍රජා අදහස් ලබාගැනීමේ වැඩමුළු ඇරඹීම |

| ක්‍රියාත්මක කරන ආයතනය | දිස්ත්‍රික්ක | ක්‍රියාකාරකම් | කාර්යසාධනය |
|---|---|---|---|
| | | ක්‍රියාත්මක හැකියාවක් වැඩිදියුණු කිරීමට සහාය දීම | ■ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ සැලසුම්කරණ ඒකකවලට තොරතුරු තාක්ෂණ උපකරණ සැපයීම<br>■ පූජා මූල සංවිධාන ජාලීය සංවාද මණ්ඩප ඇරඹීම<br>■ වවුනියා දිස්ත්‍රික්කයේ කොට්ඨාශ මට්ටමේ ආර්ථික උපදේශන සේවා මධ්‍යස්ථාන 2ක් ස්ථාපනය කිරීම<br>■ මන්නාරම හා මඩකලපුව දිස්ත්‍රික්කවල කාර්ය මණ්ඩලවල 340 දෙනෙකු සඳහා භාෂා පුහුණුව ලබාදීම |
| | | පළාත් සභා, දිස්ත්‍රික් හා කොට්ඨාශ පරිපාලන ආයතනවල හැකියා වර්ධනය | ■ වවුනියාව හා මඩකලපුව කොට්ඨාශ කාර්ය මණ්ඩලවල 159 දෙනෙකු සඳහා මානව සම්පත් පුහුණුව ලබාදීම<br>■ පුහුණුකරුවන් උදෙසා පුරවැසි ප්‍රඥප්තිය පිළිබඳ පුහුණු වැඩසටහන<br>■ තරුණයන් 252 දෙනෙකුට විශ්වවිද්‍යාලයීය තරුණ නායකත්ව සංවර්ධන පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලබාදීම |
| එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල **(UNICEF)** | අනුරාධපුර, මඩකලපුව, මන්නාරම, මොණරාගල, පුත්තලම හා වවුනියාව | අධ්‍යාපනය | පාසල් මට්ටමේ තක්සේරු හා සංවර්ධන සැලසුම් සැකසීම සඳහා පාසල් ප්‍රජාවන් 123කට සහාය දීම |
| | | සෞඛ්‍යය හා පෝෂණය | මාතෘ කණ්ඩායම් 131ක් හා සෞඛ්‍ය මධ්‍යස්ථාන 9ක් ඉදිකිරීම |
| | | ජලය, සනීපාරක්ෂාව හා ස්වස්ථතාව | ■ පවුල් 760කට ගුණාත්මක ජල පහසුකම් සැපයීම<br>■ පවුල් 160කට වැඩිදියුණු සනීපාරක්ෂක පහසුකම් සැපයීම |
| | | රැකවරණය | ළමයින් 552 දෙනෙකුට ප්‍රතිලාභ සැලසෙන ග්‍රාමීය ළමා අයිතිවාසිකම් නිරීක්ෂණ කමිටු 148ක් පිහිටුවීම |

| | | | |
|---|---|---|---|
| **ව්‍යාපෘති සේවා සඳහා වූ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNOPS)** | අනුරාධපුර, මඩකලපුව, මන්නාරම, මොණරාගල, පුත්තලම හා වවුනියාව | කසළ කළමනාකරණය | ■ මඩකලපුව කොම්පෝස්ට් ව්‍යාපෘති 4ක් ආරම්භ කිරීම<br>■ වවුනියාව හා මන්නාරම සමස්ත මළාපවහන කාණුවලින් 55% ක් සම්පූර්ණ කිරීම |
| **ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO)** | | පශු සම්පත් සංවර්ධනය | කිරි ගම්මාන සංවර්ධනය<br>පසු මිදුල් කුකුළු පාලනය |
| | | ධීවර කර්මාන්තය සංවර්ධනය | පොදු ධීවර සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර ධීවර කර්මාන්තය ඇරඹීම, කලපුවල කොටු රෝපණ ක්‍රමයට සාගරික මසුන් ඇති කිරීම |
| | | භෝග නිෂ්පාදනයට සහාය වීම | ඉඩම් සංවර්ධනය, පලතුරු භෝග හා බීජ නිෂ්පාදන සහාය |
| | | වැව් පුනරුත්ථාපනය | කුඩා, මධ්‍ය හා මහා පරිමාණ වැව් 46ක් පුනරුත්ථාපනය කිරීම |
| **ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)** | අම්පාර, මඩකලපුව, මන්නාරම හා වවුනියාව | වෘත්තිය පුහුණුව | ■ තරුණයින් 635කට වෙළෙඳපොල නැඹුරු රැකියා පුහුණුව ලබාදීම<br>■ වවු. හා මන්. දිස්. රැකියා සේවා මධ්‍යස්ථාන 2ක් ස්ථාපනය කිරීම<br>■ මඩකල., වවු.,මන්. දි.වෘත්තීය පුහුණු සංසද 3ක් සවිබල ගැන්වීම<br>■ අර්ධ නිපුණ කාර්මික ශිල්පීන් 400 දෙනෙකුට ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය ලබාගැනීම සඳහා තක්සේරු කිරීම |
| **ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා ආයතනය (IFC)** | | මූල්‍ය පහසුකම් සම්පාදනය | ■ ප්‍රතිලාභීන් 17,000කට ඇ.ඩො. මිලියන 31.0 ණය ලබා දීම ඉන් 50%ක් කාන්තාවන් සඳහාය.<br>■ කෘෂි වටිනාකම් දාම විශ්ලේෂණයක් සිදු කිරීම<br>■ ප්‍රායෝගික භූ සංචාරක සිතියම් මාර්ගෝප දේශන රූපවාහිනී වැඩසටහනක් විකාශනය කිරීම<br>■ රාජ්‍ය පෞද්ගලික අංශ සංවාදයක් සඳහා භූ සංචාරක කළමනාකරණ මණ්ඩලයක් පිහිටුවීම<br>■ සමායතනික පාලනය පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවැත්වීම<br>■ ක්‍රියාකාරී සිල්ලර වෙළඳුන් 400 දෙනෙකුට පුහුණුව ලබාදීම |

මෙම වැඩසටහන සඳහා 2015 වර්ෂයට යුරෝ මිලියන 11781.0ක් වෙන් කෙරුණු අතර 2015 වර්ෂය අවසානයට වියදම යුරෝ මිලියන 19482.0ක් විය.

## 6.5.2.14. වවුනියාව, සාලම්බේකුලම අල්-අක්ෂා මහා විද්‍යාලයට තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම

| | | |
|---|---|---|
| **ණය ආධාර සපයන ආයතනය** | : | පාකිස්ථානු මහ කොමසාරිස් කාර්යාලය |
| **ව්‍යාපෘති අරමුණු** | : | වවුනියාවේ පාසල් දරුවන්ගේ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා අංගසම්පූර්ණ ස්ථිර තෙමහල් පාසල් ගොඩනැගිල්ලක් සාලම්බෙකුලම අක්-අක්ෂා මහා විද්‍යාලයේ ඉදිකිරීම |
| **ව්‍යාපෘති පිරිවැය** | : | **රු.මිලියන 15.5.00** |
| **ව්‍යාපෘති කාලය** | : | 2013 - 2016 |

වවුනියාව සාලම්බෙකුලම් මුස්ලිම් විද්‍යාලයේ ඉදිකෙරෙන තෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ලෙහි පළමු සහ දෙවන මහල් ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුව 2015.09.30 දින ප්‍රදානය කරන ලද අතර, මෙහි වැඩ 2016 වසර තුළ අවසන් කිරීමට නියමිතය.

## 6.5.2.15. දේශීය ණය සහ සංවර්ධන අරමුදල

### දැක්ම

පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ප්‍රධාන මූල්‍ය ආයතනය වීම.

### මෙහෙවර

පළාත් පාලන ආයතන බලප්‍රදේශවල මූලික යටිතල පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් තිරසාර සහ ස්වාධීන මූල්‍ය ආයතනයක් තුළින් රටේ සමාජ සහ ආර්ථික වර්ධනයට දායකවීම.

### කාර්යභාරය

දේශීය ණය සහ සංවර්ධන අරමුදල 1916 අංක 22 දරණ ආඥා පණතින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය 2010 වර්ෂයේ සිට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතට අයත් වේ. දිවයිනේ පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය සහ ආදායම් උත්පාදක ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමට අවශ්‍ය අරමුදල් සහන ණය ක්‍රමයක් යටතේ සපයනු ලබන එකම රාජ්‍ය ආයතනයයි.

පළාත් පාලන ආයතන වෙත ණය මුදල් නිකුත් කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති පහත දැක්වේ.

1. ආර්ථික මධ්‍යස්ථාන ඉදිකිරීම සහ සතිපොළ නවීකරණය කිරීම
2. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
3. ආදාහනාගාර ඉදිකිරීම
4. මාර්ග ඉදිකිරීමේ යන්ත්‍ර සූත්‍ර සහ කසල අපහරණය සඳහා ට්‍රැක්ටර් මිලදීගැනීම
5. පොදු වෙළඳපළ ඉදිකිරීම
6. කාර්යාල ගොඩනැගිලි සහ පුස්තකාල ඉදිකිරීම්
7. මාර්ග සංවර්ධන ව්‍යාපෘති
8. පානීය ජල සැපයුම් ව්‍යාපෘති
9. වෙනත් ආදායම් උත්පාදක ව්‍යාපෘති

### අරමුදල්

ණය මුදල් සැපයීම සඳහා අවශ්‍ය අරමුදල් සහන පොළී පදනමක් මත වසර 25 කින් ආපසු ගෙවිය යුතු ණය මුදලක් වශයෙන් මහා භාණ්ඩාගාරය විසින් ලබාදේ. මීට අමතරව ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත පළාත් පාලන ආයතන සඳහා නිකුත් කළ ණය මුදල් ආපසු අයකර මහා භාණ්ඩාගාරය වෙත ගෙවීමේ වගකීම ද දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇති අතර, එම අරමුදල් පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම සඳහා චක්‍රීය කිරීමේ පහසුකම්ද සලසා ඇත. 2015 වර්ෂයේදී පළාත් පාලන ආයතන වෙත ණය දීම සඳහා රු.මි. 500 ක මුදලක් වෙන් කර තිබූ අතර ඉන් රු.මි. 293ක් වියදම් කර ඇත. මේ යටතේ සිදු කර ඇති ඉදිකිරීම් හා මිලදී ගැනීම් කාර්යයන් පහත පරිදිය.

- වෙළඳ සංකීර්ණ ඉදිකිරීම -7
- බැකෝ ලෝඩර් 4ක් මිලදී ගැනීම
- අවංමංගල රථ 1 ක් මිලදී ගැනීම
- ආදාහනාගාර 6ක් ඉදිකිරීම
- මෝටර් ග්‍රේඩර් 1ක් මිලදී ගැනීම
- ආර්ථික මධ්‍යස්ථාන 1ක් ඉදිකිරීම
- පීඩන යන්ත්‍ර 1 ක් මිලදී ගැනීම
- ත්‍රිරෝද රථ 5ක් මිලදී ගැනීම


## ණය වාරික අයකිරීමේ ප්‍රගතිය

| පළාත | ඇස්තමේන්තු වටිනාකම | පොළී ලැබීම් | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| මධ්‍යම | 50,000,000 | 10,802,270 | 22 |
| නැගෙනහිර | 40,000,000 | 7,664,000 | 19 |
| උතුරු මැද | 50,000,000 | 16,000,000 | 32 |
| උතුර | 70,000,000 | 9,400,000 | 13 |
| වයඹ | 60,000,000 | 3,360,000 | 6 |
| සබරගමුව | 120,000,000 | 13,500,000 | 11 |
| දකුණු | 20,000,000 | 20,438,400 | 102 |
| ඌව | 20,000,000 | 4,108,000 | 21 |
| බස්නාහිර | 70,000,000 | 207,317,000 | 296 |
| **එකතුව** | **500,000,000** | **292,589,670** | **59** |

## 2015 වර්ෂයේදී ණය පොළිය අයකිරීමේ ප්‍රගතිය

| පළාත | 2015 වර්ෂය (30.09.2015 දිනට) | | |
|---|---|---|---|
| | ජනවාරි - සැප්තැම්බර් | | |
| | ඇස්තමේන්තු වටිනාකම | පොළී ලැබීම් | ප්‍රගතිය (%) |
| මධ්‍යම | 84,022,641 | 71,792,823 | 85 |
| නැගෙනහිර | 14,823,743 | 9,497,184 | 64 |
| උතුරු මැද | 27,665,464 | 22,141,549 | 80 |
| උතුර | 19,681,098 | 16,329,280 | 83 |
| වයඹ | 72,204,177 | 65,677,213 | 91 |
| සබරගමුව | 29,933,299 | 19,983,750 | 67 |
| දකුණු | 33,859,183 | 26,672,441 | 79 |
| ඌව | 36,761,812 | 25,319,748 | 69 |
| බස්නාහිර | 86,534,989 | 78,106,968 | 90 |
| **එකතුව** | **405,486,406** | **335,520,956** | 83 |


ණය වාරික යාකිරීමේ ප්‍රගතිය - 2015 වර්ෂය




ණය පොළිය අයකිරීමේ ප්‍රගතිය

| පළාත | 2015 වර්ෂය (31.12.2015 දිනට) | | |
|---|---|---|---|
| | ජනවාරි-දෙසැම්බර් | | |
| | ඇස්තමේන්තු වටිනාකම | පොළී ලැබීම් | ප්‍රගතිය (%) |
| මධ්‍යම | 90,868,065 | 63,437,675 | 70 |
| නැගෙනහිර | 8,492,469 | 5,659,099 | 67 |
| උතුරු මැද | 22,255,130 | 17,217,459 | 77 |
| උතුර | 14,799,317 | 12,775,467 | 86 |
| වයඹ | 44,795,966 | 37,379,441 | 83 |
| සබරගමුව | 22,739,364 | 14,087,749 | 62 |
| දකුණු | 20,869,730 | 13,216,644 | 63 |
| ඌව | 26,303,895 | 19,568,611 | 74 |
| බස්නාහිර | 76,214,557 | 71,109,243 | 93 |
| එකතුව | 327,338,493 | 254,451,388 | 78 |

ණය පොළී අයකිරීමේ ප්‍රගතිය - 2015 වර්ෂය



පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
330, යුනියන් පෙදෙස, කොළඹ 02

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
330, யூனியன் பிளேஸ், கொழும்பு 02.

Ministry of Provincial Councils and Local Government
330, Union Place, Colombo 02.

Print & Print Graphics (Pvt) Ltd. 011-2687870